In the ancient *puṣkara* shown in Nātyaśāstra 16 syllables (*akṣara* or *varna*) are seen (Marasinghe,2014;188). That is; ක ඛ, ග ඝ, ත ථ, ද ධ, ට ඨ, ඩ ඪ, ම ර ල ව. The *akṣara* born from the right face of the drum are ක ට ඪ ත ථ ර. The *akṣara* born from the left face of the drum are ඝ, ම, හ. The *akṣara* born from the *urdva* face are ග, ද. The *akṣaras* born from *aliṁgya* are ඛ, ඨ, ඩ, ධ and ල. There are many *mahaprāṇa akṣara* formed by the combination of vowels and consonants. That is ඛ, ඛෙ, ඛෝ, ඝ, ඝි, ඝු, ඝො, ඨ, ඨා, ඨී, ඨො, ඨම්, ථ, ථා, ථී, ථෛ, ධ, ධා, ධි, ධෙ, ධම්, ඝ, ධ්‍ර, ද්ධං, ද්ධා.

Sanskrit remained dominant in India until the emergence of a new literary language introduced by the Mohammedan invaders in the 13th century (Keith, 1965; 10). In certain styles that emerged after the Mohammedan invasion, a combination of Sanskrit and Persian languages was used, leading to the use of mixed terms. Musical instruments like Pakhāvaj and Tablā utilize *miśra akṣara* (combined syllables). It is believed that after the Mūgal influence, Indian music evolved into two separate systems, Northern and Southern.

According to the sounds experimentally organized by the Mūgals, new practices were formed, leading to the creation of new types of *rāga, tāla, tēka,*

and Instruments, among others, in North Indian music. The Mridanga, for instance, was used in South Indian music, while its counterpart in North India, with some variations and Persian influences, came to be known as Pakhāvaj in that music system. Unique playing styles were also developed for these instruments, taking on a different form from their original structure.

The Mridanga was the main accompaniment of *Drupad* singing, which was popular in medieval times. It is widely believed that Mridanga was introduced as Pakhāvaj around the 15th century. Currently, Pakhāvaj is known as Mridanga in North India and Mridangam in South India. There are notable differences between the North and South Mridanga(m) in certain akṣaras, sounds, and playing styles (Kiriwaththuduwa, 2016; 11). It is also noteworthy that in North India, Mridangaya is used as Pakhāvaj, where *mahaprāṇa akṣaras* are utilized in both speech and writing, whereas in South India, these *akṣaras* are not in use.

Later, instruments like the Tablā were created to fulfill the requirement for an instrument that produced a soft sound suitable for singing styles like *khyāl* and *tarāanā*. The production of the Tablā was also inspired by instruments that produced a more solemn sound, such as the Pakhāvaj. According to Indian beliefs, drumming has its origins in the divine, attributed to the great Brahma. It seems that the history of the Tablā is not so far back, but there is no such attribution for instruments such as Tablā, although verses were used to attribute a deity to the drum.

The relationship between sound and speech differs from the relationship between *akṣara* or varna in writing. It is observed that the *mahaprāṇa akṣara* used in writing are pronounced with *alpaprāṇa akṣara* in normal pronunciation.

However, when it comes to *avanaddha pada*, pronounced during the playing of musical instruments, such as "ඡන්ද-චන්ද," "ඛණිජ-කනිජ," "ඝන-ගන," "ඡායා-චායා," they are pronounced with great vigor. The sound produced during the playing of these instruments takes on a distinct and dynamic form, showcasing the unique and expressive nature of *avanaddha pada.*

The correspondence between sounds and letters is divided into two parts. That is,

1. Simple letters – letters representing only one sound -(අ ඉ එ ඔ)
2. Compound letters – two or more sounds represented by a letter

(ක්+අ = කා, ක්+ඊ = කී)

In the history of Sri Lankan pottery, inspirations from India are commonly seen. The practice of *avanaddha vādya*, associated with Buddhism, gained prominence during the Dutugemunu kingdom period (161-137 BC) with the influence of the *tēvākāraka* group, who were among the 18 caste people that arrived after the *śrī maha bōdhiya* was brought to Sri Lanka.

In the Thupavaṁsa (Piyarathana Thero, 1946), which is believed to have been composed during the Polonnaruva era or Dambadeni era, there is a classification of goods called '*pancatūrya,*' and within this classification, the *avanaddha vādya* set holds a special place. In contemporary times, among the musical instruments used in Sri Lanka, drums like *gäṭa beraya, daula, tammättama,* and *maddalaya* hold a significant and special position in the cultural and musical heritage of the country.

The classical dance of Sinhala theater art have been based on different ideas, such as y*akkänuma, asna,* and *āvänduma*, which are evident in

*kohombāyakkaṁkāriya*. The main instrument used for these dances is the *gäṭa beraya*, also known as the upcountry drum. The *avanaddha vādya* used for various dances and *śāntikarma*, specific to each region, differ in their composition and style. For instance, *yak beraya* is mainly used for low-country dance, while *daula* is used for Sabaragamu dance,

The fundamental *akṣara* used in Sri Lankan drums are based on four basic *akṣara* (*bījākṣara*), namely තත්, ජිත්, තොං, and නත්. In addition to these, there are other *akṣara* known as *garbhākṣara*, which include තං, ට, ග, ද, ඩ, හ, රි, කි, ට, ගා, ගො, දො, රො, කුං, රු and කු. Indeed, while the basic form of *bījākṣara* includes තත්, ජිත්, තොං and නත් there are variations in sound production that can be observed when playing these *akṣara* on different drums. The foundational *pada*, employed for learning to play the drums in local drumming, comprises two types of *akṣara*: *bījākṣara* and *garbhākṣara*.

තාන් ජීං ජිං තාන් ජිං ජිං ගත්ත ජිත්ත ගත ජීංතං දෝං දොංජිං ගජිං

Dancers believe that when the Celestial Waves align with the sounds produced by the *gäṭa beraya*, they create a divine attraction. This is why *magul bera vādana* (a kind of drum playing) occurs at the onset of auspicious events. It is believed that through receiving the Celestial Waves, any malevolent influences will dissipate. Sēdaraman (1966;13) remarked that using *magul bera vādana* in accordance with the *iṣṭāniṣṭa gana* is an imitation of the Vedic perspective.

For this purpose, special types of playing called *dēva pada* are used. *Dēva pada* is composed of *guru pada* and *vaṭṭam pada*, which are a standardized set of auspicious compositions

තංජිං තංජිං තකජිං ගත කුදගජිං

*Guru padaya -* තරිකිට කුං දං කුං දං ජිං ජිං ගජ්ජිං

*Vaṭṭam padaya -* තකුදං ජිං ජිං තකුතක ජිං ජිං

Attribution of a deity to *bījākṣara* birth is done by fomer artists. Accordingly,

ත කරෝ මේඝ නාදංච

දි කරෝ අශ්ව නාදකං

තොං කරෝ කුංච නාදසය

නං කරෝ සිංහ නාදකං

Attempts have been made to confirm that these sounds are natural sounds. Karunarathna Bandara(2014) quotes an old poem related to *bījākṣara*

තත් කී අකුර මුනිඳුට නමස්කාරෙකි

දිත් කී අකුර දෙවිඳුට නමස්කාරෙකි

තොං කී අකුර ගුරුනට නමස්කාරෙකි

නං කී අකුර සබයට නමස්කාරෙකි

There are poems used separately for each type of *akṣara* (Bandara, 2014; 98, 99). Many factors influence the sound produced by different types of drums, including the nature of the wood, the type of skin used, the style of playing, and the instruments used.

ත බෙරයේ වම්පස මැදට

තොං බෙරයේ වම්පස අයිනට

ජිත් බෙරයේ දකුණු පස මැදට

නං බෙරයේ දකුණුපස අයිනට

All these *akṣara* are played on one side of the drum only, similar to the *śuddha akṣara* played on the Tablā. They are also referred to as *śuddha akṣara*. However, *akṣara* like ර, රෑ, රෑඃ are known as *ūnakṣara* which are played with the combination of other *akṣara*.

As they cannot be produced independently without the support of another phoneme, some people refer to them as composite characters. However, a special feature of these *akṣara is* that after one *akṣara* is played, the other *akṣara* is played sequentially. It is different from playing two *akṣaras* of the Tablā played simultaneously like 'Dhā'.

- *akṣara* "ඊ" is formed by combining the *akṣara* කිටකුදටකුං and playing them sequentially.
- akṣara "රෑං"- It is formed by combining the *akṣara* කිටකුං and playing them sequentially for a long time .
- The long playing of the *akṣara* "ර" and "රෑ" is called *surala*. It is played with the initial "ඊ" figure in practice.

Characters born from the left face of *gäṭa beraya* can also be born from the right face. Characters like කි, තත්, ත, ති. have a special feature wherein after one *akṣara* is played, the other *akṣara* follows. For certain *akṣara*, even if both hands are played simultaneously, they are not considered *miśra akṣara*. Some people refer to *akṣara* that are played in conjunction with another *akṣara* as *ūnakṣara*. *akṣara* like ර, රෑඃ, රෑං are examples of *ūnakṣara*.

*Akṣara* produced on the left side of *gäṭa bera*ya can also be produced on the right side.It is as follows;

ජිං අක්‍ෂරයට පසු ව තත් දකුණිින්

ග අක්ෂරයට පසු ව තතත් දකුණිින්

කුං අක්ෂරයට පසු ව ත දකුණු ඇසින්

ක අක්ෂරයට පසු ව ත දකුණු ඇසින්

In *peralum saramba* when ත is followed by තා the *akṣara* is played with the right face (තකුදඬ) (Bandara, 2000;98,99).

| manner of utterance | manner of playing |
|---|---|
| කඩ තකු | තකටකු |
| තරිකිට | තට ගත |
| තෙහිං | තකුං |
| තක්රොං | තක්කඩ දොන් |
| තක්රොං | ජික්කඩ දොං |
| තහර්ජිත් | තකටකුජිත් |
| දොහොකඩ | තකුදඬ |
| තරිකිට දොම්කිට | තකට කුද කුදට |
| කඩ ජිබ්බඩකුං | කඩජිත් ගත දොං |
| දොම්කිට කිටදොම් | කුද ගජිංගත දොම් |

A drum term called *aḍavva* played according to the above method can be mentioned in the following way.

තාම් දොම්තිගත දොම්කිට කඩතක තරිකිට කිතක දොම්තගත කිත්තක් කුදකුද තාකු ජිත්තගත දොම්කිට තරිකිට කුංදත්තා

These *akṣaras* and verses, which are provided for the *gäṭa beraya*, are also employed similarly in speech and playing for instruments like the *pahataraṭa beraya* and *daula*.

In the history of Sri Lanka information about low-country drums (*yak beraya* or *pahatarața beraya*) can be found after the 18th century. The basic akṣara තද් දිත් ගුං නං දිගතං is the fundamental *akṣara* played in the Low Country drum (Bandara,2005;63,64). However, it is not possible to produce the *akṣara* "ජිත්" with the *yak beraya*. There are slight differences in the usage of *yak beraya* based on certain traditions, such as Raigam, Matara, and Ahangama. In the Sabaragamu tradition, fundamental *akṣara* are played as තත් දිත්(ජිත්) තොං ජෙං (Kumaratunga,2018;96). When playing the *yak beraya* and *daula*, *akṣaras* are also produced by hitting one side of the instrument while simultaneously pressing the other side. In the context of *maddalaya* used in *nādagam* tradition, *akṣara* like දිකුම් තාකු දොම්, තකුම තරිකිට are played. The fundamental *akṣara* used in mridangam playing in Southern India are indeed based on the syllables තත්, ජිත්, තොං, නන්. When playing the mridangam, the syllables තා, දිත්, ගුම්/දොම්, නම් are used.

In Tablā and Pakhāvaj, two types of syllables based on the manner of playing, known as '*śuddha*' and '*miśra*,' and two other types named, '*kulā*' and '*band*,' which are based on the sound production are used. A special feature observed here is that, apart from a few *Mahaprāṇa akṣara* like "ධුම" සෙ", all other *śuddha akṣara* are considered *alpaprāṇa*. The *miśra akṣara* are produced by playing two ś*udda akṣara* simultaneously.

e.g. තා + ගෙ =ධා, තිං + ගෙ = ධිං, ති+ගෙ = ධි

It is also special that the දිං *akṣara* of Pakhāvaj is played as a *śuddha akṣara*. The solemn sound when the ධා akṣara is played on the Pakhāvaj is different from the sound produced when the ධා is played on the Tablā. In certain styles of Tablā playing like Benares and Lucknow, the rising sound when the 'ධා' is

played does not appear in *gurukula* in Delhi.

It is also noteworthy that the "දිං" of Pakhāvaj is played as a *śuddha akṣara*. The solemn sound produced when the "ධා" is played on the Pakhāvaj is distinct from the sound produced when the "ධා" is played on the Tablā. In certain styles of Tablā playing, such as Benares and Lucknow, the open sound when "ධා" is played is not found in the Delhi style.

In both instruments, all rising misrs *akṣara* are pronounced as *mahaprāṇa*; however, neither *mahaprāṇa* nor *alpaprāṇa* is actually heard during the playing of the *akṣaras*. In this context, the *alpaprāṇa akṣara* represent characters from human language that symbolize the sound of the drum, but they do not fully replicate the actual sound of the drum. Rather, they serve as a relative expression. The study of drumming has established that drum sounds can be effectively identified using human language characters for educational purposes.

Kandyan dance and Bharata Nāṭyam or Kathak dance serve as an illustrative examples of the differences between Indian and Sri Lankan vocabulary. In Kandyan dance, the feet land on the ground smoothly, while in Bharathanatyam or Kathak dance, the feet firmly touch the ground. This difference is evident in the practice of the respective dance forms. Moreover, in Kathak dance, *mahaprāṇa akṣaras* are extensively used in the verses played, whereas in Kandyan dance, when the Kandyan drum is employed, all the verses played are in *alpaprāṇa akṣara*.

The term "*tāla*" can evoke a rhythm that conveys both heavy and light elements. This aspect is also noticeable in the word "Drum," where both

compounding and disjunction occur during the performance of a certain rhythm by clapping.

Using *mahaprāṇa akṣaras* in rhythmic figures ensures a sound balance. It allows for a strong and energetic start and facilitates a seamless transition when returning from the last syllable to the first syllable. This might explain why *mahaprāṇa akṣaras* are commonly used as the basic syllables in many Thalas.

Having the syllables associated with the rhythmic form is essential to maintain its vibrancy. These *mahaprāṇa akṣara* also play a significant role in dividing many Tablā bols like *qāidā, gat, rēlā,* into two parts. Furthermore, they are capable of delivering distinct sounds that are closely tied to the specific *tāla* during both teaching and absorption. This theory reflects the fundamental factors that influence the formation of a rhythm pattern: the Transitive (also known as heavy or bass) and the Intransitive (light or sharp) aspects.

These *mahaprāṇa akṣara* are essential for delivering the distinctive sounds that are closely linked to the specific Thala during both teaching and absorption of the rhythm. They reflect the fundamental elements that influence the formation of a rhythm pattern, namely the Transitive (also known as heavy or bass) and the Intransitive (light or sharp) aspects.

In this research conducted with Indian and Sri Lankan membranophones, it was observed that the *akṣara* used for playing the membranophones are represented by two syllables in speaking and writing. Presently, *mahaprāṇa akṣara* are used as *miśra akṣara*, which are exclusively used in Tablā and Pakhāvaj. In conclusion, the akṣara used in Tablā and Pakhāvaj can be classified

into *śuddha* and *miśra akṣara* as well as *kulā* and *band akṣara* based on the manner of playing and sound respectively, while a separate classification can be made for *mahaprāṇa* and *alpaprāṇa akṣara* used in speech and writing only.

## References

කිරිවත්තුඩුව, කරුණාරත්න. (2016). *පඛාවජ් වාදන කලාව සහ තාල ශාස්ත්‍රය.* කොළඹ: සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

කුමාරතුංග, සමන්. (2018). *සබරගමු දවුල.* කොළඹ: සූරිය ප්‍රකාශන.

ගොඩකුඹුර, චාර්ල්ස්. (1963). *කොහොඹකංකාරිය.* කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

දිසානායක, ජේ. බී. (2018). *නිවැරදි සිංහලය.* නුගේගොඩ: සුමිත ප්‍රකාශන.

දිසානායක, ජේ. බී. (2021). *බසක මහිම.* නුගේගොඩ: සුමිත ප්‍රකාශන.

පියරතන හිමි, මකුළුදූවේ (සංස්.). (1946). *ථූපවංසය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

පීරිස්, ඩී. ආර්. (1995). *සම්භාව්‍ය තාල දීපනී.* කොළඹ: සූරිය ප්‍රකාශන.

බණ්ඩාර, කරුණාරත්න. (2000). *උඩරට බෙර වාදන කලාව.* කර්තෘ ප්‍රකාශන.

බණ්ඩාර, කරුණාරත්න. (2005). *පහතරට බෙර වාදන සම්ප්‍රදාය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

භරතමුනි. (2014). *භරතමුනිප්‍රණීත නාට්‍යශාස්ත්‍රය.* (වෝල්ටර් මාරසිංහ පරි.) කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණතුංග, විජේරත්න. (2003). *තබ්ලාව.* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

රෝලින්ග්සන්. (1959). *භාරතීය සංස්කෘතික ඉතිහාසය.* (පරවහැර ප්‍රඥානන්ද හිමි සහ ඩී. ඒ. වෙදගේ, පරි.) කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්ත්මේන්තුව.

සුමනදාස, කේ. ඩී. පී. (2007). *උඩරට පාරම්පරික නර්තන හා වාදන පරම්පරා.* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

සුමනසාර හිමි, තිඹිරිවැව. (2007). *සිංහල භාෂාවේ ව්‍යාකරණ.* කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සේදරමන්, ජේ. ඊ. (1966). *උඩරට තාල ශාස්ත්‍රය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

සේදරමන්, ජේ. ඊ. (1967). *බලි යාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

Keith, Beridale. (1965). *Sanskrutha Sahithya Ithihasaya*. (G.S.B.Senanayake, Trans. ). Colombo: M.D.Gunasena & Co.Ltd.

Kippen, James. (1988). *The Tablā of Lucknow: A Cultural Analysis of a Musical Tradition.* Cambrige: Cambrige University Press.

Miśra, Chhotela. (2007). *Playing Techniques of Tablā-Banaras Gharana.* New Delhi:Kanishka Publishers.

Midgley, R. (1976). *Musical Instruments of the World" An Illustrated Encyclopedia with more than 4000 original drawings.* the Diagram Group.

Sankaran, Trichy. (1994). *The Rhythmic principles & practice of South Indian Drumming.* Toronto: Lalith Publishers .

# Non-verbal Communication in Ancient Sri Lankan Society

M. Nandana Wijenama

## Abstract

Sri Lankan society is rooted in collectivism emphasizing communal values and traditions. In the past, rural inhabitants lived authentically, embracing a simple lifestyle closely tied to their cultural heritage. In these rural areas, where agriculture played a central role, people utilized non-verbal communication methods, such as gestures and body language, in conjunction with verbal communication to share ideas and maintain their tight-knit communities. The research problem examines how symbolic non-verbal communication methods were used meaningfully and effectively in ancient agricultural society. The purpose of this study is to unveil the meanings represented by the symbolic communication methods employed in ancient agricultural society. Utilizing the qualitative research method, a conclusion is derived through the examination of literary sources, field visits to historical farming colonies, and the analysis of information gathered from local villagers. The foundation of village law was rooted in non-verbal communication, holding a more potent and prevalent role than verbal communication within the ancient village society. This form of communication was carried out with great meaning and creativity.

*Keywords:* Sri Lankan society, collectivism, non-verbal communication, symbolic communication methods, agricultural society

Submitted on 22 April 2023
Revised on 25 May 2023
Accepted on 27 May 2023
*JCDSKAR, 2*(1) 2023 June, 72-88 pp
nandana.w@vpa.ac.lk

# පැරණි ශ්‍රී ලාංකේය ජන සමාජයේ භාවිත අවාචික සංනිවේදනය

එම්. නන්දන විජේනාම

**සංක්ෂිප්තය**

ශ්‍රී ලාංකේය ජන ජීවිතය සාමූහිකත්වය පදනම් කර-ගත්තකි. සාම්ප්‍රදායික ජීවන රටාවකට උරුමකම් කී පැරණි සිංහලයා උපතේ සිට මරණය තෙක් ම ගත කළ ජීවිතය මුළුමනින් ම එක ම රිද්මයකට පෙළ ගැසුණු අව්‍යාජ වූවකි. කෘෂිකාර්මික ජීවන රටාවකට හුරු පුරුදු වී සිටි ගැමියා අන්‍යයන් හා අදහස් හුවමාරු කිරීම සඳහා වාචික සංනිවේදන ක්‍රමයට අමතර ව විවිධ සංකේත ඇසුරු කර-ගනිමින් සිදු කළ අවාචික සංනිවේදන ක්‍රම ද භාවිත කළේ ය. පැරණි කෘෂිකාර්මික සමාජය තුළ සංකේතාත්මක අවාචික සංනිවේදන ක්‍රම අර්ථාන්විත ව සහ ඵලදායී ව භාවිත වූයේ කෙසේ ද යන්න පර්යේෂණයේ ගැටලුව යි. පැරණි කෘෂිකාර්මික සමාජයේ භාවිත සංකේතාත්මක සංනිවේදන ක්‍රමවලින් නිරූපණය වන අරුත් මතු කර-ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය අනුව සාහිත්‍යාගත මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් සහ පැරණි ගොවි ජනපදවල සංචාරය කොට එම ගැමි ජනතාවගෙන් ලබා-ගත් තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අවසාන නිගමනයට එළඹෙයි. ගැමි නීතිය සැකසී තිබුණේ අවාචික සංනිවේදනය පදනම් ව ය. පැරණි ගැමි සමාජය තුළ වාචික සංනිවේදනයට වඩා අවාචික සංනිවේදනය ඉතාමත් ප්‍රබල ව හා පුළුල් ව පැවති අතර එය ඉතාමත් අර්ථාන්විත ව සහ නිර්මාණාත්මක ව සිදු කොට ඇත.

*ප්‍රමුඛ පද:* ලාංකේය ජන සමාජය, සාමූහිකත්වය, අවාචික සංනිවේදනය, සංකේතාත්මක සංනිවේදන ක්‍රම, කෘෂිකාර්මික සමාජය

## හැඳින්වීම

දෙපාර්ශවයක් හෝ පාර්ශවයන් කීපයක් අතර සිදු කෙරෙන අදහස් හුවමාරුව සංනිවේදනය ලෙස හැඳින්විය හැකි ය. සංනිවේදනයේ දී සිදු වන්නේ ආකල්ප පෞද්ගලික ව හෝ පොදු වශයෙන් බෙදා-ගැනීමකි (විජේතුංග, 1989). මෙය අතිශය පුළුල් ක්‍රියාවලියකි. යම් ජන කොට්ඨාශයක් තුළ සිදු වන සංනිවේදනයෙහි ප්‍රබලතාව රැඳී-පවතින්නේ එම ජන කොට්ඨාශය තුළ සිටින සාමාජිකයින් අනුව ය. එය සංනිවේදනයේ ස්වභාවය යි. මානව සම්බන්ධතා ඇති කර-ගැනීම සඳහා පසුබිම සැකසෙන්නේ එමගිනි (Berlo, 1960, p.xi). භෂාව

මාධ්‍ය කොට-ගෙන වාචික ව සිදු කෙරෙන සංනිවේදනය **වාචික සංනිවේදනය** වශයෙනුත්, සංඥා හා සංකේත උපයෝගී කර-ගනිමින් සිදු කෙරෙන සංනිවේදනය **අවාචික සංනිවේදනය** වශයෙනුත් සරල ව නිර්වචනය කළ හැකි ය.

පැරණි සිංහල ගැමියා අදහස් හුවමාරු කර-ගැනීම හා තොරතුරු සංනිවේදනය කිරීම සඳහා විද්‍යුත් මාධ්‍ය භාවිත නොකළ ද, යම් යම් කරුණු පිළිබඳ දැනුම් දීම සඳහා ප්‍රබල සංනිවේදනය ක්‍රමයක් අනුගමනය කළ හ. අවාචික ව නමුත් සංකේතාත්මක ව සිදු කළ මෙම සංනිවේදන ක්‍රමය මඩ ගොවිතැනේ දී හා ගොඩ ගොවිතැනේ දී මෙන් ම ගෘහාශ්‍රිත කටයුතුවල දී ද සංනිවේදන ක්‍රමයක් ලෙස භාවිත කොට ඇත. අතීතයේ පැවති සංනිවේදන ක්‍රමයක් වුව ද අදටත් විවිධ සමාජ කොට්ඨාශවල මෙම අවාචික සංනිවේදන ක්‍රම භාවිතයේ පවතියි. පැරණි කෘෂිකාර්මික සමාජය තුළ අවාචික සංනිවේදන ක්‍රම අර්ථාන්විත ව සහ ඵලදායී ව භාවිත කළේ ද යන්න පිළිබඳ සොයා-බැලෙන මෙම අධ්‍යයනයෙන් සංකේතාත්මක ව සිදු කළ සංනිවේදන ක්‍රම පිළිබඳ ව හා ඒවායේ නිරූපිත අරුත් මතු කර-ගැනීම අරමුණු කර-ගැනේ.

**පැරණි ගැමි සංනිවේදනය**

අද්‍යතන සමාජයේ මුද්‍රණ හා විද්‍යුත් තාක්ෂණය අනුසාරයෙන් අතිශය දියුණු සහ සංකීර්ණ සංනිවේදන මාධ්‍ය භාවිතයට ගැනුණ ද සාම්ප්‍රදායික ජන සමාජයෙහි සංනිවේදන අවශ්‍යතා සපුරා-ගැනුණේ අතිශය සරල එහෙත් සංනිවේදන ශක්‍යතාවෙන් ඉහළ අවාචික සංනිවේදන ක්‍රමෝපායයන් අනුගමනය කරමිනි (Ihalagama, 2019). අවාචික සංනිවේදනය හුදෙක් අතීතයට පමණක් සීමාවූවක් නො වේ. දියුණු තාක්ෂණික මාධ්‍ය මගින් වර්තමානයේ සිදු කෙරෙන සංනිවේදන කාර්යයන්හි දී පවා ශාරීරික භාෂාව උපයෝගී කර-ගැනෙන්නේ අවාචික සංඥා හා සංකේත ක්‍රමවල ඇති සංනිවේදන හැකියාවේ ප්‍රබලතාව නිසා ය.

පැරණි සංනිවේදනය ක්‍රම අතර ජනප්‍රිය වී ඇත්තේ කට කථාව, ඔිපාදූප, කවි කොළය, කැලෑ පත්තර, අඬ බෙර, ආදී දේවල් ය. පැරණි ගැමි සමාජයේ ප්‍රධාන වගාව වී ගොවිතැන යි. ගොවිතැන් කටයුතුවල දී සියලු දෙනා ම පොදු හැඟීමකින් යුතු ව කටයුතු කිරීම ගොවි සමාජයේ දක්නට ලැබුණු සිරිතකි. වී වැපිරීම, පැල සිටුවීම, වල් නෙළීම, ගොයම් කැපීම, පෑගීම, සී සෑම, පෝරු ගෑම, වැනි කාර්යයන් තනි පුද්ගලයෙකුට කළ නොහැකි ය.

වී ගොවිතැන හා සම්බන්ධ සංනිවේදන අවස්ථා කිහිපයක් පැරණි ගැමි සමාජයේ දක්නට ලැබේ. නෙළුමේ දී නෙළුම් ගී ගායනයත්, කුඹුර සැකසීමේ දී අඬහැර පෑමත්, කොළ මැඩීමේ දී කමත් ගී ගායනයත් ඒ පිළිබඳ සමාජය දැනුවත් කිරීමේ සංනිවේදන මාධ්‍ය ලෙස භාවිත කර ඇත.

හේන් ගොවිතැන ද පැරණි ජන සමාජයේ ගොවිතැන් ක්‍රමයකි. හේන් කොටා, බීජ වපුරා, ඒවා රැක-ගැනීමට ගොවියා ඉමහත් වෙහෙස මහන්සියක් ගනී. සිය භෝග සතුන්ගෙන් ආරක්‍ෂා කර-ගැනීමට හේනේ පැලක් තනා එහි වාසය කරයි. මෙහි දී පැල් ගී ගායනා කරමින් අනෙක් ගොවීන් සමග අදහස් සංනිවේදනය කර-ගනී. අතීතයේ දී ගැමියා ගොවිකම හැරුණු විට තවත් කර්මාන්තවල යෙදුණි. පතල් කර්මාන්තය ඉන් එකකි. දෝනාවේ සිට පිටත සිටින්නා සමග අදහස් හුවමාරු කර-ගත්තේ පතල් ගී ගායනය කිරීමෙනි.

අතීතයේ පොහොය දිනය ද සංනිවේදනය අවස්ථාවකි. පන්සල් යාම, තෙරුවන් සරණ යාම, බණ ඇසීම, පෙරහැර කිරීම, කඨින පිංකම, පොහොය මුල් කොට සිදු වේ. ගැමියාට පුන් පොහෝ දිනය සංනිවේදනය වූයේ පූර්ණ චන්ද්‍රයා මගිනි.

පැරණි සමාජයේ "පිලේ පැදුර" හොඳ සංනිවේදන මධ්‍යස්ථානයකි. ගැමි නිවසේ ඉස්තෝප්පු කොටසේ ඉඳ ගැනීමට හැකි පරිදි සාදන ලද කොට බිත්තිය "පිල" වේ. බිත්තිය උඩට පැදුරක් එලයි. විට හෙප්පුව මෙතැන ප්‍රධානතම අංගයකි. ගම්මුන් පැමිණ මෙතැනට වී අල්ලාප සල්ලාපයේ යෙදේ.

අම්බලම පැරණි ගැමි සමාජයේ තවත් හොඳ සංනිවේදන මධ්‍යස්ථානයකි. මෙය විඩාව නිවා-ගැනීමේ සහ නවාතැන් ගැනීමේ මධ්‍යස්ථානයකි. ගමේ ඇත්තන් පමණක් නො ව රටේ නොයෙක් දෙසින් අමුත්තෝ ද මෙතැනට පැමිණෙති. ගමේ පමණක් නො ව රටේ තොරතුරු ද මෙතැනින් සංනිවේදනය වෙයි. පෙර රජ දවස රජු පිළිබඳ වර්ණනා ද ගැමියා වෙත ලැබෙන්නට සැලැස්වූයේ ද අම්බලම ඇසුරෙහි ය (සියාතු, සම්මුඛ සාකච්ඡා. 2006.05.20). **කඩ පිල, කෝපි කඬේ**, සහ **හන්දියේ කඬේ** ද පැරැණි ගැමියා ගේ සංනිවේදන මධ්‍යස්ථාන විය. තේ බීමට හෝ කෝපි බීමට කඩයට ගොඩ වන ගැමියෝ විවිධ වූ දේ කථා කරති; පුවත් පත් බලති. මෙහි දී කට කතා ද හුවමාරු වෙයි. පාරේ බෝක්කුව හා මාර ගස තරුණයින් ගේ සංනිවේදන මධ්‍යස්ථාන යි.

පැරණි ගැමි සමාජය තුළ කටකතා, ඕපාදූප, කසුකුසු ආදි සංනිවේදනය ක්‍රම ප්‍රධාන වෙයි. (ආරියරත්න, 1998) කටකතා මගින් විවිධ ආරංචි පැතිර යයි. පැරැණි සමාජයෙහි කටකතා යනු ක්ෂණික සංනිවේදනය මාධ්‍යයකි. මෙය ප්‍රතික්ෂේප කළ හැක්කක් නො වේ. නිසි ලෙස යොදා-ගැනීම අදට ද වැඩදායක වෙයි. ඕපාදූප යනු නොවටිනා කතා ලෙස හැඳින්විය හැකි ය. අනුන් ගේ දෙයක් උපහාසයෙන් කතා කිරීම මෙහි දී සිදු වේ. පැරණි ගැමියා මෙය අනර්ථයක් ලෙස සැලකුවේ ය (බණ්ඩාර, සම්මුඛ සාකච්ඡා, 2009.08.12). නමුත් නූතන ජනමාධ්‍යයේ මෙය අත්‍යවශ්‍ය ම අංගයක් වී ඇත. කසුකුසු යනු කනින් කනට මුමුණා කීම යි. මෙය ද පැරණි ගැමි සමාජයේ කාන්තාවන් අතර ප්‍රචලිත ව පැවති එහෙත් ගැමි සමාජය ප්‍රතික්ෂේප කළ සංනිවේදනය මාධ්‍යයකි. මෙය සංනිවේදන මාධ්‍යයක් සේ ම කුමන්ත්‍රණයක අරම්භය බව ගැමියෝ විශ්වාස කළ හ.

පන්සල ද අවාචික සංනිවේදන ක්‍රම බහුල ව ම භාවිත කළ ස්ථානයකි. පන්සලේ අවාචික සංනිවේදනය සිදු කළ ප්‍රධාන උපකරණය සාන්ඨාරය යි. වනාන්තර අභිමුඛ ව පවත්වා-ගෙන යන සේනාසනවල සංනිවේදන කාර්යය සිදු කර ඇත්තේ දඬු බෙරය මූලික කර-ගෙන ය. මෙම ක්‍රමය කුරුණෑගල ප්‍රදේශයේ ආරණ්‍ය සේනාසනවල දැක-ගත හැකි ය (ආරියරත්න, 1998).

පැරණි ගැමි සමාජය තුළ සංකේත භාවිත කරමින් සිදු වූ සංනිවේදන ක්‍රියාවලියේ දී ඔවුන් විවිධ සංකේත ඇසුරෙහි නිරූපණය කළ අරුත තියුණු වූවකි. සංකේතාත්මක සංනිවේදනයේ දී එයින් නිරූපණය වන අරුත් වටහා-ගැනීමට දෙපාර්ශවය ම ඒ පිළිබඳ මනා වැටහීමකින් සිටිය යුතු ය. ගැමියා ඒ පිළිබඳ අවබෝධය ලබා-ගත්තේ පොතපතින් නො ව සමාජ අනුභූති ඔස්සේ ය. අතීතයේ පැවති අවාචික සංනිවේදන අවස්ථා පහත ආකාරයෙන් ඉදිරිපත් කළ හැකි ය.

## වේවැල් ඇරීම

හෙන් ගොවිතැන් ක්‍රමය අනුව කැළයේ තනි ව එක් අයෙකු පමණක් හේනක් කිරීම සම්ප්‍රදාය නො වේ. සමූහයක් ලෙස එකට එකතු වී එක ළඟ හේන් වැඩි ප්‍රමාණයක් සාදයි. ඉන් පසු හේනේ වගා කර ඒවා සතුන්ගෙන් ආරක්ෂා කර-ගැනීමට පැල් රැකීම අරම්භ කරයි. හේන් ගොවිතැනේ දී පැල් රැකීම විශේෂ වූ අංගයකි. වේවැල් ඇරීම සාමූහික බව පෙන්නුම් කිරීමට යොදා-ගත් තවත් එක් සංනිවේදනය උපක්‍රමයකි. මෙය පැල් රැකීමේ දී අනෙකුත් හේන්වල සිටින ගොවීන් අතර තමන් නොනිඳා-සිටින බව දැන්වීමට යොදන උපක්‍රමයකි. මෙම ක්‍රමය නැගෙනහිර පළාතේ දෙමළ ගොවීන් අතර පැවති එක්තරා ක්‍රමයක් බව වැව් ගම් පත්තුවේ පැරැණි ගැමියෝ කියති (කහඳගමගේ 1995). ඔවුන් ගේ මෙම ක්‍රමය පහත සඳහන් අයුරින් පැහැදිලි කළ හැකි ය. මෙම ක්‍රියාව ආරම්භ කරන්නේ රාත්‍රි කාලයේ පරිසරයේ නිහැඬියාවත්, රාත්‍රි සතුන් ගේ ගමනාරම්භයත් සමග ය.

ගොවියා මෙය වේවැල වැඩම වීම ලෙස හඳුන්වයි. පළමු පැලේ ගොවියා විසින් ළඟ ම ඇති පැලේ ගොවියාට වේවැල ගෙන ගොස් ලබා-දෙයි. වේවැල දෙවෙනි පැලේ ගොවියාට දුන් බව අනෙක් පැල්වල ගොවීන්ට දැන්වීම සඳහා "මම අසවලාට වේවැල දුන්නා" යැ යි හඬ නගා පවසයි. මෙසේ පැලෙන් පැලට වේවැල වඩමවයි. ඉහත ආකාරයෙන් ම මධ්‍යම රාත්‍රිය වන විට "මිණි ගෙඩිය" වඩමවයි. එය ද පැලෙන් පැලට යවයි. අළුයම වන විට "හුළු එළියක්" යැවීම සිදු

කරයි. එය ද පැල් තනා ඇති යාය වටේ ම ගොස් පළමුවැන්නා ගේ පැලට එන විට හිරු එළිය වැටීමට ආසන්න වේ. එක් පැලක ගොවියෙක් වේවැල හෝ මිණි ගෙඩිය හෝ හුළු එළිය හෝ රැගෙන එන විට අනෙක් පැලේ ගොවියා පෙර මගට පැමිණ එය බාර-ගත යුතු ය. මේවා බාර-ගැනීමට ගොවියෙක් පෙර මගට ආවේ නැති නම් ඔහුට නින්ද ගොස් ඇති බව සංකේතවත් වේ. එවිට එම පැල ළඟ නොනැවතී අනෙක් පැල ළඟට යයි. එසේ ගොස් ඊළඟට තුන්වැන්නාට දුන් බව අනෙක් අයට දැන්වීමට හඬ නගයි. පැල් රකින ගොවියන් ගේ පෙළ ගැස්ම සියලු දෙනා දන්නා නිසා අසවල් ගොවියාට නින්ද ගොස් ඇති බව සියලු දෙනාට සංනිවේදනය වෙයි.

**සත්ත්ව රූප ඇටවීම**

පොල් පිතිවල මුල කොටසින් කැපූ කුරුලු රූප කෝටුවල ගසා සවි කිරීම පහත රට ප්‍රදේශයේ කුඹුරුවල දැකිය හැකි ය. එසේ ම පොල් ලෙලි ආදියෙන් කැපූ කුරුල්ලන් සවි කිරීම තුන් කෝරළය පුරා කුඹුරුවල දැකිය හැකි ක්‍රියාවකි (කහඳගමගේ 1995). පුවක් කොළ උපයෝගී කර-ගෙන විශාල කුරුලු රූප වර්ග සාදා ගොයමේ අටවන අතර කුඹුර තුළ ගොක් කොළ ඇද හාවා ගේ කන් ලෙස දිස් වන පරිදි සකස් කරයි. මෙසේ කරන්නේ වපුරන ලද බීජ කුරුල්ලන් ගෙන් ආරක්‍ෂා කර-ගැනීමටයි (අප්පුහාමි,සම්මුඛ සාකච්ඡා, 2005. 01. 03). මෙහි දක්නට ඇත්තේ ද නිර්මාණාත්මක අවාචික සංනිවේදනයකි.

**පඹයන් බැඳීම**

පඹයන් බැඳීම ආදි ගොවි සිරිතකි. කෙත විනාශ කරනු පිණිස පැමිණෙන සතුන් බිය වැද්දීම සඳහා මිනිස් රුවට සමාන ව සිදු කෙරෙන නිර්මාණය **පඹයා** ලෙස හැඳින්වෙයි. කෙත ආරක්ෂා කිරීම පිණිස කෙතේ සිටුවනු ලබන පඹයා පිළිබඳ විස්තරයක් "සයංජාත මාලය" නම් කාව්‍යයෙහි අඩංගු වෙයි (සියාතු, සම්මුඛ සාකච්ඡා. 2006.05.20).

තැන් තැන් වල කෙත වටකර වාපූ
මින් සූකරයෝ එන මග දකපූ
ඉන් බිය සේ අය ලෙසටම ගහපූ
තැන් තැන් වල පඹයන් සිටවාපූ

"පනවා කණු පිට පඹයෝ සදතී"යනුවෙන් ගොයම් මාලයෙන් ද පඹයින් බැඳීම ගැන කියැ වේ. කෙතේ සිටින පඹයා දකින සත්තු බිය වී පලා යති. එසේ වන්නේ පඹයා ද මිනිසෙකු ලෙස සතුනට සංනිවේදනය වීම නිසා ය. පැරණි සමාජයේ ගොවියා පීඩනයට ලක් කළ උසස් නිල දරුවන් උපහාසයට සහ අපහාසයට ලක් කරමින් අහිංසක විරෝධයක් පෑමට ද පඹයා වැනි සංකේත භාවිත කොට ඇත. මේ සඳහා ඇතැම් තැනක පඹයාට "ටයි කෝට්" අන්දවා යම්කිසි නිලධාරියෙක් ලෙස හැඩ ගන්වා කුඹුරේ සිටවයි (සියාතු, සම්මුඛ සාකච්ඡා. 2006.05.20).

උසස් යැ යි සම්මත පැරණි සමාජයේ සමහර කාන්තාවෝ කොණ්ඩය කැපීම, කොට ගවුම ඇඳීම, කිමෝනා ඇඳීම ආදිය සිදු කළ හ. පැරණි ජන සමාජය මෙය පිළිගත්තේ නැත. එයට විරෝධය ලෙස ඒ අයුරින් සකස් කරන ලද කාන්තා පඹයින් කෙතට රැකවල් ලා සිටුවා ඇත. පැරණි ගැමියා මේ අයුරින් අවාචික සංනිවේදනයයෙන් ගොවි බිම් රැක-ගත්තා සේ ම තම සමාජයට ද යම් කිසි හොඳ පණිවිඩයක් සංනිවේදනය කළේ ය.

## අප්පිඩි ලෑල්ල බැඳීම

වගාවට හානි පමුණුවන සතුන් පලවා-හැරීම සඳහා යොදන ලද උපක්‍රමයක් ලෙස "අප්පිඩි ලෑල්ල" හඳුන්වා දිය හැකි ය. මෙම අප්පිඩි ලෑල්ලේ ශබ්දය සතුන්ට සංනිවේදනය වීමෙන් එයට බිය වී සත්තු පැන දුවති. මෙය සෑදීම සඳහා උණ ගසක් භාවිත කෙරෙයි. පුරුක් හතරක් දිගට උණ කොට කැබැල්ලක් ගෙන එහි මුල පුරුක උල් කර ගැනේ. අග පුරුක් දෙක අඩක් වන සේ පලයි. දෙවෙනි පුරුකට සම්බන්ධ වූ පැලූ කොටසේ ඝණකම අඩු කරයි. උල් කළ කොටස

බිම සිටුවයි. එහි ඉහළ කොටසේ හිලක් විද ලණුවක් දමා එය පැලට යා කරයි. ලණුව අදින විට සිහින් පතුර උඩට විත් ලණුව අතහරින විට එය අනෙක් පතුරේ වදී. එවිට අත්පුඩි ගසනවා සේ ශබ්දයක් නැගේ. මෙය සතුන්ට සංනිවේදනය වන්නේ  මිනිසා ගේ ක්‍රියාවක් ලෙසට යි. එවිට සත්තු පැන දුවති.

හූව

මිනිස් භාෂාව සුවිශේෂ වූ සංනිවේදනය මාධ්‍යයකි. මිනිස් භාෂාවේ සීමිත ශබ්ද ප්‍රමාණයකින් අර්ථ ගණනාවක් ගෙන දෙන ලෙස සකස් වී ඇත. මිනිසා විසින් නිකුත් කරන ශබ්දවලින් අදහස් කරන්නේ කුමක් ද යන්න තීරණය කරනු ලබන්නේ පවතින සමාජ සම්ප්‍රදාය මගිනි. මිනිසා නිකුත් කරන ශබ්ද පමණක් කොතරම් අර්ථ සම්පන්න ව සංනිවේදන ක්‍රියාවලිය සඳහා යොදා-ගත්තා ද යි "හූව" පමණක් අධ්‍යයනය කිරීමෙන් වටහා-ගත හැකි ය. හූ හඬ විවිධාකාර වූ අර්ථ ගෙන දෙන අයුරින් ගෙන තම අරමුණු මුදුන් පමුණුවා-ගැනීම සඳහා යොදා-ගෙන ඇත. යම් කෙනෙකු සිටින තැන දැන ගැනීමට, වන සතුන් බිය කිරීමට, අනුන්ට හිංසා කිරීමට, සමාජ විරෝධය දක්වන සංකේතයක් ලෙස ට ද, විනෝදය සඳහා ද හූව භාවිත කෙරෙයි (සියාතු, සම්මුඛ සාකච්ඡා, 2006.05.20).

දඩයම් යුගයේ සිට හූව ගැමි ජනතාව ගේ ප්‍රධාන සංනිවේදනය මාධ්‍යයක් විය. ගැමියා ඇසෙන හූවේ ධ්වනිය අනුව සහ හැඩය අනුව එයින් සංකේතවත් වන්නේ කුමක් ද යන්න තේරුම් ගනී. හූ හඬෙහි සාම්ප්‍රදායික ක්‍රමයක් ඇත. යමෙක් ඇමතීමට නඟන හූවත්, අනතුරක් දැක්වීමට නගන හූවත් අතර ධ්වනියෙහි වෙනසක් ඇත. හූ හඬෙහි අඩු වැඩි බවත්, හඬ නඟන අයුරුත් අනුව එයින් සංනිවේදනය කරන්නේ කුමක් ද යන්න ගැමියා වටහා-ගනී. ගම ගෙදර පොල් අතු බැදීම සංනිවේදනය කරන්නේ ද හූ හඬ දීමෙනි. ගොවිතැන් කරන විට අත්තමට ගොවියන් ගෙන්වා-ගැනීමට භාවිත කරන්නේ ද හූ හඬයි. පැල් රැකීමේ දී තමන් පැලට පැමිණ ඇති බව අනෙක් ගොවීන්ට දැන්වීමට ද හූ හඬ භාවිත කර ඇත.

### අතු හං නැමීම

වනයේ තැනින් තැන ගස්වල කොළ අතු කඩා බිමට නමා තැබීමේ සංනිවේදන ක්‍රමයක් ද අතීතයේ දී භාවිත විය. මෙය අතු හං නැමීම ලෙස හැඳින්වුණ අතර තමන් වනයේ ගමන් කළ බවට අන් අයට සංනිවේදනය කිරීම මෙහි අරමුණ විය. මෙම සංකේතයෙන් මී වද, වටිනා දෑව කොටස්, දඩයම් කළ සතකු ගේ සිරුර, තිබෙන ඉසව්ව දැනුම් දීම සේ ම, ඒවායේ අයිතිය පෙර අතු හං නමාපු අයට බව ද සංනිවේදනය කෙරෙයි. එවිට අතු හං නැමූ අයට අයුක්තියක් නොකරයි. ගැමියා තමන් ගමන් ගත් මාර්ගය අන් අයට දැන්වීමටත්, තමාට ආ මග අඳුනා-ගැනීමටත් තැනින් තැන ඇති ගස්වල අතු බිමට කඩා-දමයි. එසේ ම විශාල ගස්වල තම අත ඇති පිහියෙන් දිශාව පෙන්වීමට ඊ තල සංකේතය යොදයි. තණ පිට්ටනියක නම් උස තණ පඳුරු එකට බැඳ, තමා යන දිශාවට නවා-තබයි. මෙවැනි සංකේතයන් තැබීමට බැරි තැන්වල ගලක් මත ගලක් තබා හෝ ගල මත තව ගලකින් ඊ තල ඇඳ හෝ මග සලකුණු තබයි (ඇතුගල, 1998).

### බොල් වීනා තැබීම

සාමාජීය සත්ත්වයකු වන මිනිසාට සමාජ සම්බන්ධතාවලින් තොර ව ජීවත් විය නො හැකි ය. එවැනි සමාජ සම්බන්ධතා අපේක්ෂා කරන්නේ නම් සමාජය සඳහා ඔහු විසින් ඉටු කළ යුතු යුතුකම් සහ වගකීම් කොටසක් ඇත. ඔහු මෙන් ම සමාජය ද ආරක්ෂා විය යුතු ය. ඒ යුතුකම පැරැණි මිනිසා අකුරට ම පිළිපැද්ද බව ඔවුන් සතු සංනිවේදනය ක්‍රමවලින් මනාව පසක් වෙයි. වනයේ ගමන් කිරීමේ දී හෝ රාත්‍රි කාලයේ දී යම් තැනක සර්පයෙකු දුටුවේ නම් හෝ පාඩුවේ සිටීම ගැමියා ගේ පුරුද්ද නො වේ. එය අන් අයට දැන්වීමේ වගකීමට ඔහු බැඳී සිටී. ඒ සඳහා ඔවුන් භාවිත කරන සංනිවේදනය ක්‍රමය" බොල් වීනා තැබීම" ලෙස හඳුන්වයි. මෙහි දී සිදු වන්නේ බොල් වීනා කොළ කඩා ගෙනවිත් බෝලයක් මෙන් සාදා අවශ්‍ය තැන තබා ඒ මත ගලක් තැබීම යි. මෙය දකින ගැමියා ඒ අසල සර්පයෙකු ගැවසෙන බව දැන ගනියි. කිසිවිට ගැමියා තමා මුහුණ

දුන් අනතුර තවත් ගැමියෙකුට සිදු වන්නට දුන්නේ නැත. තමන් මුහුණ දුන් අනතුර අන්‍යයන්ට දැන්වීම තම වගකීමක් බව පැරැණි ගැමියෝ කල්පනා කළ හ. මෙම අවාචික සංනිවේදන ක්‍රමය වන්නි පළාත්වල සහ නුවර කලාවියේ සමහර ප්‍රදේශවල වර්තමානයේ දී ද භාවිත කරයි (බණ්ඩාර, සම්මුඛ සාකච්ඡා,2009.08.12).

**කොළ අතු එල්ලීම**

පැපොල, සරම්ප, කම්මුල්ගාය බෝ වන රෝග වේ. මෙය පැතිර ගියහොත් වසංගත රෝග තත්ත්වයට පත් වේ. පැරැන්නන් මෙම රෝග දෙවියන් ගේ රෝග ලෙස හැඳින්වීය. බෝ වන රෝග මිනිසාට ඇති වන්නේ දෙවියන් ගේ කෝප වීම නිසා බව පැරැණි ගැමියෝ සිතූ හ. නිවසක මෙවන් රෝගී තත්ත්වයක් ඇති නම් කඩුල්ලේ අඹ කොළ අත්තක් හෝ කොහොඹ කොළ අත්තක් එල්ලයි. හෙළ වෛද්‍ය ක්‍රමයට අනුව මෙම අඹ සහ කොහොඹ විෂ වර්ග විනාශ කරයි. ඇතැම් පළාත්වල මේ සඳහා ගොක් රැහැනක් අදිය; ඇතැම් ප්‍රදේශවල කඩුල්ලේ කනු දෙකින් එකක හරක් හිස් කබලක් තබයි. පැරැණි ජන සමාජයේ මිනිසා ඉතාමත් ප්‍රබල සංකේත භාවිත කරන්නෙකු විය. මෙවැනි අවාචික සංනිවේදන ක්‍රම භාවිත කරමින් ලෙඩ දුකින් අනෙක් ගැමියා ගලවා-ගැනීම ඉතා හොඳ ගති පැවැත්මකි.

**වසංගත වැටිය**

පුරාණ ගමියාට ගවයා සම්පතකි. කරත්තය බැඳීමට, බඩු ප්‍රවාහනයට, ගොවිතැන් කටයුතුවලට, කිරි ලබා-ගැනීමට, ගවයා යොදා-ගනී. ගැමියා ගවයාට හොඳින් සලකයි. ගවයාට මුඛ රෝග හා කුර රෝග සෑදෙයි. මෙය පැතිර යන වසංගත රෝගී තත්ත්වයකි. ගොවියාට වැදගත් වන්නේ තමා ගේ හෝ ගමේ හරකුන් පමණක් නො වේ. පිට ගම්වල ගවයන් කෙරෙහි ද අනුකම්පා දක්වයි. **ඒ අත්තම් ක්‍රමය*** නිසා යි. මෙම වසංගත රෝගී තත්ත්වය ගමෙන් පිටතට යා නොදී ගවයන් රැක-ගැනීම තමා ගේ වගකීමක් ලෙස ඔවුහු සිතූ හ. ඒ සඳහා

* අත්තම-ප්‍රතිඋපකාර වශයෙන් කරන වැඩ (සංක්ෂිප්ත සිංහල ශබ්දකෝෂය)

සුදුසු ම උපක්‍රමය නම් තම ගමේ හරකුන් සමග අහළ ගම්වල හරකුන් මුහු වීම වැලැක්වීමට අහළ ගම්වල ගොවියන්ට ඒ පිළිබඳ ව දැනුම් දීම යි. ඒ සඳහා ඔවුහු **වසංගත වැටිය කෙටීම** නමින් අවාචික සංනිවේදන ක්‍රමයක් භාවිත කරති. ගමට ඇතුළු වන ප්‍රධාන මාර්ගය හරහා අතු රිකිලි කඩා-දමා, පාර අහුරා, කනු සිටුවා, ඒ මත හරක් හිසක් සවි කරයි. මෙය දකින පිට ගම්වල වැසියෝ ඔවුන් ගේ හරක් එම ගමට යා නොදී රැක-ගනිති. මෙම සංනිවේදන ක්‍රමය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රදේශයේ අද ද දක්නට ඇත.

### බුලත් දීම

ගම්බද ව පවතින බුලත් දීමෙන් කෙරෙන ආරාධනය ද පෙර සිට පැවත එන අවාචික සංනිවේදනය ක්‍රමයකි. බුලත් කොළයේ නැට්ට බුලත් ගන්නා දෙසට තබා බුලත් දීම මංගල උත්සවයක් සඳහා ආරාධනයකි. බුලත් කොළයේ වලිගය බුලත් ගන්නා දෙසට හරවා-දීම අවමංගල්‍යයක් සඳහා කෙරෙන ආරාධනයකි (බණ්ඩාර, සම්මුඛ සාකච්ඡා, 2009.08.12). මෙම සංනිවේදන ක්‍රමය තලාව ප්‍රදේශයේ දැක-ගත හැකි ය.

### බෝල බැඳීම

ගැමි නීතිය සැකසී තිබුණේ ද, ගමේ ප්‍රධානීන් විසින් ගැමියාට නියෝග දෙන ලද්දේ ද අවාචික සංනිවේදනය මගිනි. බෝල බැඳීම ගැමි සමාජයේ තිබූ තහනම් නියෝගයකි. වැවේ මාළු අල්ලා ආහාරයට ගැනීම සහ වෙළඳාම් කිරීම ගැමියා ගේ තවත් ජීවනෝපාය මාර්ගයකි. වැවේ වතුර සිඳී යන කාලයේ දී වෙල් විදානේ විසින් වැවේ මාළු ඇල්ලීම තහනම් කිරීමට වැව් කණ්ඩියේ කෝටුවක් සිටුවා ඒ මත බූ හනස්සක් බඳී. එය **බෝල බැඳීම** නමින් ව්‍යවහාර කෙරෙයි. එසේ ම කුඹුරේ පන් නෙළීම හා වැව් කණ්ඩියේ තණ කොළ කැපීම තහනම් කිරීමට ද මෙම බෝල බැඳීම සිදු කෙරෙයි. මේ සඳහා බූ හනස්සක් ම බඳින්නේ තහනම කඩ කලොත් නින්දා අපහාස විඳින්නට සිදු වන බව ගැමියාට සංනිවේදනය කිරීමට යි.

## වල් ඇල්ලීම

වල් ඇල්ලීම ද කෙනෙකු ගේ අයිතිය ප්‍රකාශ කරන සංනිවේදනයකි. හේනක් කෙටීම සඳහා හෝ යම් කිසි අවශ්‍යතාවක් නිසා හෝ මූකලානක්, නව දූල්ලක්, ලන්දක්, කොටා එළි පෙහෙළි කරන්නට අදහස් කරන ගැමියා හා හා පුරා කියා තමන් කැමති ඉසව්වේ වල් අත්තක් කපා බිම හෙළයි. එය දුටු කිසිවකු ඒ ඉසව්වේ වල් කොටන්නට ඉදිරිපත් නො වේ. ගම්බද ව වාසය කරන ගැමියා ජීවනෝපාය ලෙස කළේ මඩ ගොවිතැන හෝ ගොඩ ගොවිතැන යි. මඩ ගොවිතැන සඳහා යොදා-ගත් කුඹුර ප්‍රවේණි කුඹුරක් හෝ අඳ කුඹුරක් විය හැකි ය. එහෙත් ගොඩ ගොවිතැන හා සම්බන්ධ ඉඩම රජය සතු දේපලකි. හේන් කෙටීමට ප්‍රථම ගොවියන් හේනට නම නියම කිරීම ද වල් ඇල්ලීම ලෙස නම් කර ඇත.

## සොකඩ එල්ලීම

සොකඩය ද පැරණි ගැමියා ගේ අවාචික සංනිවේදන සංකේතයකි. 19 වන සියවස අග භාගය වන තෙක් ගමේ හැම පදිංචි කරුවකුට ම ගව පට්ටිය බැගින් තිබිණ. ගවයන් බැද්දට ගොස් ආහාර සොයා-ගැනීමක් එ දවස සිදු විය. ගොවියාට තම ගවයන් තෝරා-බේරා-ගැනීමට අත්‍යවශ්‍යයෙන් ම වුවමනා විය. එම නිසා තමතමන් ගේ ගවයින් ගේ කරේ සොකඩය බැගින් එල්ලයි. මෙය ලීවලින් සාදා-ගත්තකි. මාසයෙන් මාසය ලී වර්ග මාරු කරන බැවින් එක් එක් ගව පට්ටියෙන් නැගෙන නාදය එකෙ'කින් වෙනස් ය (සියාතු, සම්මුඛ සාකච්ඡා, 2006.5.20).

## කුළු පේ කිරීම

ගැමියාට යම් යම් අවස්ථාවල දී යම් හේතු මත ස්වකීය පෞද්ගලික අවශ්‍යතා සෙසු අයගෙන් සඟවා-ගන්නට සිදු වේ. එවිට ඒ බව සමාජයේ සෙසු අයට ශිෂ්ට සම්පන්න ලෙස දැනුම් දිය යුතු ය. මේ සඳහා උපයෝගී කර-ගන්නා

අවාචික සංනිවේදන ක්‍රම රාශියක් ගැමියා සතු වේ. "**කුළු පේ කිරීම**" එවැන්නකි. ඉරගල වැටෙන්නට ප්‍රථම ගැමියා හේනට යයි. ඔහුට ගම බිරිය සමග අඹු සැමියන් ලෙස හැසිරීමට සිදු වන්නේ ද දිවා කාලයේ දී ය (ඇඳගම 2003). ගැමි පැල්පතේ කාමර කිහිපයක් නොමැත. ඇත්තේ එක කාමරයකි. දොර ද තාවකාලික ව සකසා ඇත. ගෙදරට පැමිණෙන්නෙකුට මේ මොහොත ගෙදර සිටින ගැමියා අඹු සැමියන් ලෙස හැසිරෙන අවස්ථාව බව දැන්වීම සඳහා දොරකඩ කුල්ල අටවා-තබයි (මානෑව 2001). මෙය **කුළු පේ කිරීම** ලෙස හැඳින්වෙයි.

**අමුඩ පේ කිරීම**

උඩ රට ප්‍රදේශයේ ඇතැම් තැන්වල "**එක ගෙයි කෑම**" තවමත් සිදු වෙයි. මෙම සිරිත ඇති වීමට හේතු ගණනාවක් තිබේ. ප්‍රධාන ම හේතුව දේපල බෙදී-යාම වැලැක්වීම යි. දෙවැනි කරුණ ලෙස සැලකිය හැක්කේ සිංහල රාජ්‍ය සමයේ පැවති වැඩ වසම් ක්‍රමය යි. වැඩ වසම් ක්‍රමයේ දී රජු ගේ නියමය පරිදි වැව් බැඳීමට, වෙහෙර විහාර තැනීමට, යුද්ධ සඳහා, ඔවුන් අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු ය. එවිට තම පවුල බලා-ගැනීමට තවත් පුරුෂයකු අවශ්‍ය විය. එම අවශ්‍යතාව නිසා ද මෙම සිරිත ඇති විය. එක ගෙයි කෑම විවාහ ක්‍රමයේ දී ගෙදර සිටින සහෝදරයින් සියලු දෙනා ම වෙනුවෙන් වැඩිමහල් සහෝදරයා ස්ත්‍රියක් සරණ පාවා ගනී. අනෙක් සහෝදරයින් ද අයියා ගේ බිරිඳ ලෙස සැලකීම සම්ප්‍රදාය යි. නමුත් උඩරට සම්ප්‍රදාය අනුව සියලු ම සහෝදරයන්ට මෙමෙ ස්ත්‍රිය බිරිඳ වෙයි. කිසියම් සහෝදරයෙකුට යම් දිනක රාත්‍රියේ එම ස්ත්‍රිය සමග සහවාසයේ යෙදීමට අවශ්‍ය නම් තම අමුඩය එම ස්ත්‍රිය සිටින කාමරයේ දොර උඩ තැබිය යුතු යි (පීරිස් 1964). එයින් අනෙක් සහෝදරයෝ එම සංකේතයේ අරුත හඳුනා-ගෙන ඔහුට එම අවස්ථාව ලබා දෙති. මෙය **අමුඩ පේ කිරීම** නම් වේ. යම් කිසි පිරිමියෙක් අඳින අමුඩය ස්ත්‍රියක් විසින් හෝදනවා දුටුවොත් ඉන් හැඟෙන්නේ එම ගැහැනිය එම පුරුෂයා සමග ලිංගික සම්බන්ධතා පවත්වන බවයි (බණ්ඩාර, සම්මුඛසාකච්ඡා,2009.08.12)

### පැදුර

ලිංගික සම්බන්ධකම් ගැන කථා කරන විට **පැදුර** ද ඉතාම වැදගත් සංකේතයකි (රත්නපාල 1995). උඩරට බින්න විවාහ ක්‍රමයට අනුව ස්ත්‍රියට අවශ්‍ය නම් විවාහය අවසන් කිරීමට අවස්ථාව ඇත. එවිට ස්ත්‍රිය කළ යුත්තේ නිදන පැදුර මිදුලට විසි කිරීම යි. නිවසට එන සැමියා මෙය දුටු විට විවාහය අවසන් බව දැන ගනී. ඒ අවසරයෙන් ම ඔහු ගෙදරින් පිට ව යයි.

### කෝඩුවා වැල

පැරැණි ජන සමාජයේ අඹුසැමි සබඳතා, ලිංගිකත්වය, විවෘත ව කතා කළේ නැත. එය ලැජ්ජා සහගත කාර්යයක් බව සිතූ හ. එවැනි කරුණු පිළිබඳ ව කථා කර ඇත්තේ සංඥා හා සංකේත භාවිත කරමිනි. එක් වචනයක් හෝ නොපවසා තම සිතැගි විරුද්ධ ලිංගිකයනට පල කිරීමේ හැකියාව අවාචික සංනිවේදනය ක්‍රමවල අන්තර් ගත විය.

විවාහක ස්ත්‍රිය තම ස්වාමි පුරුෂයාට වචනයෙන් කිව නොහැකි ලිංගික කාරණාව අවාචික ව සංනිවේදනය කරයි. තමා ස්නානය සඳහා භාවිත කරන දිය රෙද්ද වැලේ වනන අයුරින් සහ වැලේ වනන ස්ථානය අනුව ස්වාමි පුරුෂයා කරුණු තේරුම් ගනී. ගැමි ගෙදර ස්වාමි පුරුෂයා ගේ රෙදි වනන වැල 'කෝඩුවා වැල' නම් විය (මානෑව 2001). ස්ත්‍රිය මෙම වැලේ රෙදි වනන්නේ නැත. කෝඩුවා වැලේ ස්ත්‍රිය දිය රෙද්ද වනා ඇත්නම් එයින් ස්වාමි පුරුෂයාට හැඟවෙන්නේ ඇයට මාසික ඔසප් වීම සිදු වී ඇති බව යි.

### කිලි වැල

උපත, මල්වර වීම, ඔසප් වීම, මරණය යන අවස්ථා කිලි සහිත අවධි ලෙස පුරාණ ගැමියා හඳුන්වයි. **කිලි වැල** නමින් රෙදි වනන වැලක් ද ගැමි ගෙදර පිටුපස තිබී ඇත. ස්ත්‍රීන් හැර වෙන කිසිවෙක් මෙහි රෙදි වනන්නේ නැත. ගම

බිරිය ගේ රෙදි මෙහි වනා ඇත්නම් පුරුෂයා එයින් තේරුම් ගන්නේ ඇය ගේ මාසික ඔසප් වීම සිදු ව ඇති බවයි (දළුපොත, 2009).

**මුරුංගා හොද්ද**

ගැහැනියට සිංහල සහ හින්දු සංස්කෘතියේ දී තමන් ගේ අවශ්‍යතා පුරුෂයා ඉදිරියේ හෝ හෙළි කිරීමට අවස්ථාවක් නැති තරම් ය. ගැහැණියට එදින රාත්‍රියේ තම පුරුෂයා සමග ලිංගික ව එක් වීමට අවශ්‍ය නම් එය පුරුෂයාට හැඟවීමට අවාචික සංනිවේදන ක්‍රමය භාවිත කරයි. එදින රාත්‍රියේ ආහාරයට මුරුංගා හොද්දක් සාදා පුරුෂයා ගේ පිඟානේ තැන් දෙකකට මුරුංගා හොදි බෙදයි. එවිට පුරුෂයා ඇය ගේ අවශ්‍යතාව තේරුම් ගනී. මෙය යාපනය ප්‍රදේශයේ ඇති සංනිවේද ක්‍රමයකි (සෝමදේව, සම්මුඛ සාකච්ඡා, 2019).

මේ ආකාරයට දීර්ඝ ව පැවසිය යුතු පණිවිඩයක් එක් සංකේතයක් පමණක් භාවිත කොට වඩාත් අරුත්බර ව හා ශිෂ්ට ආකාරයෙන් පැවසීමට පැරණි සමාජයේ පැවති හැකියාව ඔවුන් ගේ සංනිවේදන හැකියාව සහ නිර්මාණශීලී ගුණය මොනවට විදහා පාන්නක් ලෙස දැකිය හැකි ය.

**නිගමනය**

පුරාණ ගැමි සමාජය තුළ අවාචික සංනිවේදනය ඉතාමත් ම දියුණු අයුරින් යොදා-ගෙන ඇති බව මොනවට පැහැදිලි වෙයි. පරම්පරා දැනුමෙන් ආ සවිඥානිකත්වය පැරණි ජන සමාජය තුළ ප්‍රබල ව පැවතිණ. ඔවුන් ගැමි විනය ඉතා ශිෂ්ට අයුරින් පවත්වා-ගෙන ගොස් ඇත. පැරණි ගැමියා තුළ පැවති සහයෝගය සහ එකමුතු වී වැඩ කිරීමේ හැකියාව ද මෙම අවාචික, සංකේතාත්මක සංනිවේදන ක්‍රම මගින් පිළිබිඹු වෙයි. ලිංගික කටයුතුවලට, සාමාජීය කටයුතුවලට, ආගමික කටයුතුවලට මෙන් ම ගැමි නීතිය සඳහා ද අවාචික සංනිවේදනය භාවිත විය. විවිධ සංකේත ඇසුරු කර-ගනිමින් පැරණි ගැමි සමාජය තුළ පැවති

අවාචික සංනිවේදන ක්‍රම අර්ථාන්විත ව, වඩාත් නිර්මාණාත්මක ව, මෙන් ම ශිෂ්ට සම්පන්න ලෙස භාවිතයේ පැවති බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අමරසේකර, ඩී. (1996). *ජන කවිය හා ගැමි සමාජය.* ආරිය ප්‍රකාශකයෝ

ආරියපාල, එම්. (1991). *ජන ජීවිතය හා ජනශ්‍රැතිය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

ඇතුගල, ආරියරත්න. (1998). *සංජානනය හා සංනිවේදනය.* කොළඹ: ඇම්. ඩී . ගුණසේන සහ සමාගම

ඇඳගම, පණ්ඩුල. (2003). *හෙළ මග විසිතුරු.* කොළඹ: කොමර්ෂල් බැංකුව

කහඳගමගේ, පී. (1995). *කෙතක මහිම (කෙම් පහන්).* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

මහේන්ද්‍ර, එස්. (1983). *සංනිවේදනයක්ෂේත්‍රය හා ජන සංනිවේදනය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

මානැව, කේ. බී. (2001). *නුවරකලාවියේ ජනවහර*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයො

රත්නපාල, නන්දසේන. (1995). *ජනශ්‍රැති විද්‍යාව.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

විජේතුංග, රත්න. (1989). *හෙළ වහර හා සංනිවේදනය*, නුගේගොඩ: කොලිටි මුද්‍රණාලය.

අබේසිරිවර්ධන, ආනන්ද. (2007). *සංක්ෂිප්ත සිංහල ශබ්දකෝෂය.* කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

Ihalagama,Swarna, (2019 May). *Significance of Traditional Non-verbal Communication: Pattans in Sri Lanka.*

# Sri Lankan Femininity Reflected in its Folklore

Wimalasiri Munasinghe

## Abstract

Folklore serves as a significant source for studying and comprehending the culture, civilization, and history of a country. Traditionally, folklore was regarded as evidence that reflected the past customs and practices of the people. However, it has now been affirmed that folklore provides a rich wealth of knowledge in literary, cultural, and anthropological fields. In the scientific study of any society, the formal examination of its folklore holds great importance. Folklore has emerged not merely due to the individual needs of a single person but as a response to social needs. Consequently, folklore is an area of study that offers insights not only into the past and present but also into the future. One notable aspect of folklore is folk poetry, which holds a prominent place in Sinhalese culture with its long-standing legacy. Therefore, pinpointing to a specific origin for folk poetry becomes challenging. The objective of this research is to explore and analyse how Sri Lankan femininity is depicted in folklore. Specifically, the research problem addresses the question of how Sri Lankan femininity is reflected in folk poetry. This research collected information from both primary and secondary sources to illustrate the portrayal of women in folklore. Historically, folk poetry was sung to alleviate the fatigue, weariness, and anxieties of villagers during their daily tasks. It served as a method of communication to express the thoughts conceived in one's mind to others. Women are frequently depicted in these folk poems, accompanying individuals from birth until death, assuming various roles and characters. The findings firmly establish that folk poetry effectively captures the essence of Sri Lankan femininity.

*Keywords:* Communication, Folklore, Folk poet, Folk poetry, Women

---

Submitted on 10 March 2023
Revised on 18 May 2023
Accepted on 25 May 2023
*JCDSKAR, 2*(1) 2023 June, 89-121 pp
mawimal.m@gmail.com

# ජනශ්‍රැතියෙන් පිළිබිඹුවන ලාංකේය ස්ත්‍රීත්වය.

විමල්සිරි මුණසිංහ

**සංක්ෂිප්තය**

දේශයක සංස්කෘතිය, සභ්‍යත්වය හා ඉතිහාසය අධ්‍යයනය කිරීමෙහි ලා ජනශ්‍රැතිය මුඛ්‍ය මූලාශ්‍රයකි. එක් අවධියක දී ජනශ්‍රැතිය ජනතාව ගේ අතීත සිරිත් හා පැවතුම් පිළිබිඹු කෙරෙන සාක්ෂි වශයෙන් සැලකිණ. එහෙත් ජනශ්‍රැතිය මගින් සාහිත්‍යය, සංස්කෘතික හා මානව විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ට පුළුල් දැනුම් සම්භාරයක් ලබා-දෙන බව වර්තමානයේ දී තහවුරු වී ඇත. කිසියම් සමාජයක් පිළිබඳ විද්‍යාත්මක හැදෑරීමක දී ඒ සමාජය සතු ජනශ්‍රැති පිළිබඳ විධිමත් අධ්‍යයනය වැදගත් වේ. එක් පුද්ගලයකු ගේ උවමනාවක් නිසා නො ව සමාජයීය අවශ්‍යතාවක් නිසා ජනශ්‍රැති ඇති වී තිබේ. ඒ නිසා ජනශ්‍රැතිය යනු අතීතය වර්තමානය පිළිබඳ පමණක් නො ව අනාගතය පිළිබඳව ද යම් අවබෝධයක් ලද හැකි විෂය ක්ෂේත්‍රයකි. ජනශ්‍රැතියෙන් පිළිබිඹු වන ශ්‍රී ලාංකේය ස්ත්‍රීත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම, මෙම පර්යේෂණයේ අරමුණ යි. ශ්‍රී ලාංකේය ස්ත්‍රීත්වය පිළිබඳ ජන කවියේ පිළිබිඹුව කෙබඳු ද යන්න පර්යේෂණ ගැටලුව ය. ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් ලබා-ගත් තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අවසාන නිගමනයට එළඹිණි. එදිනෙදා කාර්යයන්හි නිරත වීමේ දී ඇති වන වෙහෙස, මහන්සිය සහ කාන්සිය දුරු කර-ගැනීම සඳහා අතීත ගැමියා විසින් ගයන ලද ජන කවිය හුදෙක් තම සිතෙහි උපන් සිතුවිලි අන්‍යයන්ට ප්‍රකාශ කිරීමට යොදා-ගත් සංනිවේදන ක්‍රමයකි. ජන කවි අතර, අතිශය සුලබ ව කාන්තාව පිළිබඳ සඳහන් වී ඇත. ඉපදුන මොහොතේ සිට මරණය දක්වා ම පුද්ගලයෙකුට විවිධ වූ කාන්තා චරිත හමු වේ. ජනශ්‍රැතියෙන් ඔවුන් ප්‍රතීයමාන වන අතර ශ්‍රී ලාංකේය ස්ත්‍රීත්වය ජන කවියෙන් මෙනවට පිළිබිඹු වන බව මෙම අධ්‍යයනයෙන් තහවුරු වේ.

*ප්‍රමුඛ පද: ජනකවිය, කාන්තාව, ජනකවියා, ජනශ්‍රැතිය, සංනිවේදනය*

## හැඳින්වීම

දේශයක සංස්කෘතිය සභ්‍යත්වය හා ඉතිහාසය අධ්‍යයනය කිරීමෙහි ලා ජනශ්‍රැතිය මුඛ්‍ය මූලාශ්‍රයකි. එක් අවධියක දී ජනශ්‍රැතිය ජනතාව ගේ අතීත සිරිත් හා පැවතුම් පිළිබිඹු කෙරෙන සාක්ෂි වශයෙන් සැලකිණ. ජනශ්‍රැතිය අතීතය මෙන් ම වර්තමානය පිළිබඳ නොයෙක් තොරතුරු පසක් කරයි. ජනශ්‍රැතිය, සමාජය හා එහි සාමාජිකයන් ගේ ඓතිහාසික ප්‍රභව හා තත්ත්ව නිරන්තරයෙන් සිහිපත් කරවයි. මිනිසා අතර මෙන් ම සමාජයීය ඒකකයක් වශයෙන් ඔවුන්

ගේ චර්යාවන්, පරිසරය හා ඔවුන් අතර පවතින මනා සම්බන්ධතාව විවරණය කරමින් ඔවුන් මුහුණ දෙන අභියෝග ජනශ්‍රැතියේ එක සේ අන්තර්ගත වී ඇත. එමෙන් ම සංස්කෘතියේ මූලික හරය ද එහි සුරක්ෂිත ව ඇත. ජනශ්‍රැතිය කාලය සමඟ වෙනස් නොවන්නක් නො වේ. එය තුළ ම ඊට ආවේණික ගතිකත්වයක් පවතින අතර, සමාජයේ ගතිකත්වය හා උපස්ථම්භනය එහි වෙනස විද්‍යමාන කරයි.

කිසියම් සමාජයක් පිළිබඳ විද්‍යාත්මක හැදෑරීමක දී ඒ සමාජය සතු ජනශ්‍රැති පිළිබඳ විධිමත් අධ්‍යයනය වැදගත් වේ. එක් පුද්ගලයකු ගේ උවමනාවක් නිසා නො ව සමාජයීය අවශ්‍යතාවක් නිසා ජනශ්‍රැති ඇති වී තිබේ. ඒ නිසා ජනශ්‍රැතිය යනු අතීතය වර්තමානය පිළිබඳ පමණක් නො ව අනාගතය පිළිබඳ ව ද යම් අවබෝධයක් ලද හැකි විෂය ක්ෂේත්‍රයකි. ජනකවි යනු ජනශ්‍රැතියේ එක් අංගයකි. සිංහල සංස්කෘතියේ ප්‍රමුඛ අංගයක් වන ජන කවියේ පුරාවෘත්තය ඉතා දීර්ඝ වූවකි. එහි පිළිබඳ ව නියත වශයෙන් පැවසිය නො හැකි ය. ජන කවියට ඉතිහාසයක් නොමැත. එයට ඇත්තේ වයසක් පමණි. එහෙත් වයස ද මෙපමණ යැ යි කිව නො හැකි ය. අද්‍යතනයේ කතාන්තර කීම හෝ ජන ගී ගායනය වෙනුවට මිනිසුන් බොහෝ දුරට පෙළඹී ඇත්තේ සුහුරු දුරකථනය වෙත ය. ඒ හේතුවෙන් සංස්කෘතියේ කේන්ද්‍රීය භාවය ඇති කිරීමෙහි ලා ජනශ්‍රැතියේ කාර්යභාරය ගිලිහී යමින් පවතී. එබැවින් පවත්නා ජනශ්‍රැතිකාංග වර්ග කිරීම හා ප්‍රකාශයට පත් කිරීම අත්‍යවශ්‍ය ව ඇත. එය ජනශ්‍රැතියට නව ජීවයක් නොලබා-දුන්න ද, එහි උරුමය ආරක්ෂා කර-ගැනීමෙහි ලා උපකාරී වේ. ප්‍රාථමික ශිෂ්ටාචාරයේ මිනිසා තොරතුරු හුවමාරු කළේ ජන වහර ඇසුරෙණි. එහි දීර්ඝකාලීන විකාශනයකින් පසු ඔවුහු ලේඛක වහර ඇසුරු කර-ගත් හ. මිනිසා ගේ හැඟීම් හා ඥානය බෙදා-හැරීමේ මාධ්‍යය ජනවහර වූ නිසා ම සිරිත් විරිත්, ගති පැවතුම්, කලා ශිල්ප ආදී හැම අංශයක් ම ජනවහරින් පෝෂණය විය. මෙම දැනුම ඉදිරි පරම්පරාවට සංජානනය වන්නේ ජනශ්‍රැතිය මගිනි. ජනකවිය සාමූහික එකතුවක ස්වරූපයකි. එක් පුද්ගලයෙකුගෙන් කවියක් අසන සහෘදයෙක් එය තමාට ඇසුන පරිදි වෙනස්

කිරීමෙන් හෝ තවත් කොටස් එක් කිරීමෙන් නැවත ගායනා-කරයි. මේ නිසා නිශ්චිත ආරම්භයක් හෝ ක්‍රමානුකූල ව, පරම්පරාවෙන් පරම්පරාවට ගලා ආ ස්වරූපයක් ජනකවියේ දැකිය නො හැකි ය. මේ නිසා ම නිශ්චිත කර්තෘත්වයක් ජනකවියට නැත. ජන කවියා ස්වාධීන පුද්ගලයෙකි. සම්භාව්‍ය කවි රචකයා මෙන් සම්මත කාව්‍ය ලක්ෂණයන්හි බැඳී නොසිටින ඔහු, ඉන් බැහැර ව තමාට ම ආවේණික වූ ස්වරූපයකින් හැඟීම් ප්‍රකාශ කොට ඇත. ස්වාධීන පුද්ගලයකු වන ඔහු තම සිතැඟි නිදහස් ව ප්‍රකාශ කරයි. ඒ නිසා ම ජනකවිය සරල සුගම ශෛලියක් ගන්නේ ය. ඒ ඒ ජන කවිවල අන්තර්ගත ලක්ෂණ අනුව ඒවායේ වියත් බව මෙන් ම ප්‍රාථමික ස්වරූපය ද ප්‍රතීයමාන වේ.

ජනසාහිත්‍යයේ දී ජනකවියට ප්‍රධාන තැනක් හිමිවන්නේ වින්දනයක් වන රසය භාවමය ආස්වාදයක් වන නිසා මෙන් ම ගද්‍යයට ප්‍රථම පද්‍යය බිහි වී මිනිසාට එහි හුරුපුරුදුකම තිබීම ද නිසා ය. ජනකවිය ගැමි ජනතාව ගේ ඓන්ද්‍රීය අවයවයක් සේ ක්‍රියාත්මක වීම රසය ආත්මය කොට කවිය නිපදවීම පමණක් ම නො ව, ජනකතාවට නොහැකි ශක්‍යතාවක් ජනකවියට තිබීම සහ පද්‍යය උස් හඬින් රිද්මයානුකූල ව ගායනා කළ හැකි වීම මෙන් ම, බිය හා හුදකලා බව තුනී වීමේ ශක්තියක් එහි ගැබ් ව තිබීම නිසා ය. ඇතැම් විට කරත්ත කවි ආදිය හුදෙකලා ව ම ගයනු අසන්නට ලැබේ. මෙසේ එදා පොදු ජනයා තම සිතැඟි කාර්යයන් එක් ව නොපැකිළ ව විවේචනය කළ අතර, ඒ සඳහා ප්‍රමුඛ මාධ්‍යය ලෙස යොදා-ගත්තේ ද ජනකවිය යි.

ජනකවියේ සහ ජනසාහිත්‍යයේ අගය ජී. බී. සේනානායක (1965) සිය ''විචාර ප්‍රවේශය'' නමැති කෘතියේ දී මෙසේ සඳහන් කරයි. ''උගතුන් ගේ කාව්‍යයන්හි අව්‍යාජත්වය හිඟ වුව ද ජන කාව්‍යයෙහි එය හිඟ නො වේ, උගතුන් ප්‍රිය කරන මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ වැනි කාව්‍ය කළ කවීන් ජීවිතයෙහි සුන්දරත්වය කියන ලකුණු ජන කවීන් ගේ නිර්මාණයන්හි හිඟ නො වේ. ඔවුහු උගත් කවි මෙන් ගතානුගතික ලෙස සුන්දර යැ යි සම්මත

දෙය සොයමින් වර්ණනයට තැත් නොකළ හ. ඔවුහු තමන් ගේ පරිසරයෙහි වූ ගහකොළ, ගංගා හෝ ආදියෙහි සෞන්දර්ය දැක එයින් ප්‍රමෝදයට පත් වූ හ. ජීවිතයෙහි සෞන්දර්ය ඔවුන් ගේ රචනයන්හි දැකිය හැක්කේ ඔවුන් තමන් ගේ ඒ ප්‍රමෝදය කාව්‍යයට තනා ප්‍රකාශ කළ හෙයිනි.''

මේ අන්දමට අපට දළ වශයෙන් **ජනකවිය** හා **ජනජීවිතය** සීමා කර-ගත හැකි වේ. ජනකවියේ තේමාව ජනජීවිතය යි. බොහෝ විට එදිනෙදා ජීවිතයේ කිසියම් කරුණක් ජනකවියට වස්තු විෂය විය. එය ජනකවියේ පොදු ලක්ෂණයකි. අතිශය දුෂ්කර ජීවිතයක් ගත කළ ගැමියා බිය, සන්ත්‍රාසය, ආදරය, වෛරය, ක්‍රෝධය, ද්වේශය, සෙනෙහස, අපේක්ෂාව, විශ්වාසය, සොම්නස හා දොම්නස ආදී මනෝභාව සම්මිශ්‍රණයෙන් තමා තුළ මතු වූ හැඟීම් නිරායාසයෙන් ම මුවින් ගිලිහීමට ඉඩ හළේය. මේ නිසා ජනකවියේ නිර්ව්‍යාජ ගුණය විසල් ය. තමා ජීවත් වූ පරිසරය සීමා වූ නිසා ම පරිසරය තුළ පැවති සියල්ල ඔහ ගේ අවධානයට ලක් විය. එහෙයින්, සමාජ සම්බන්ධතා පොදු ගැමි චින්තනය වටිනාකම්, ආකල්පයට උචිත සංයමයෙන් හා සරල බවින් ඉදිරිපත් කිරීමට ගැමියා සමත් වූයේ පරිසරයට මෙන් ම ජීවින්ට ද දැක්වූ ප්‍රේමණීය චින්තාව නිසා ය. ජනකවියේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් ය. එයින් ගැමි සමාජයේ පවත්නා සිරිත්-විරිත්, චර්යාධර්ම, සිතුම්-පැතුම් හෙළිදරව් වන අතර, පොදු වශයෙන් සමස්ත භෞතික පරිසරය ද චිත්‍රණය වේ.

**ජන කවියෙන් පිළිබිඹු වන ශ්‍රී ලාංකේය කාන්තාව**

ගැමි ජීවිතයේ නොයෙකුත් අවස්ථා අළලා ගැමියන් විසින් ම නිර්මාණය කරන ලද කවි ලෙස හැඳින්වෙන ජන කවි බොහොවකට ස්ත්‍රී චරිත වස්තුවිෂය වූ බව ඒවා විශ්ලේෂණය කිරීමේ දී දැකිය හැකි ය. ලිඛිත මෙන් ම අලිඛිත වශයෙන් ද ඒවා වෙන්කොට හඳුනා-ගත හැකි ය. මුඛ පරම්පරාගත ව පැවත එමින් ලිඛිත සාහිත්‍යයට එක් වූ **යශෝදරාවත, වෙස්සන්තර ජාතක කාව්‍ය** ආදිය ස්ත්‍රී චරිත ප්‍රධාන කොට-ගත් ජන කාව්‍ය ග්‍රන්ථයෝ වෙති. ශ්‍රී ලාංකීය සමාජ

සන්දර්භය තුළ කාන්තාව දියණියක, සොයුරියක, බිරිඳක, මවක වශයෙන් අනන්‍ය වූ භූමිකා රඟ දක්වයි. තව ද කාන්තාව පෙම්වතිය හෝ වෛශ්‍යාව වශයෙන් ද ජීවත් වූවා ය. ඒ සෑම භූමිකාවක ම සිටින කාන්තාව ජනගීතය තුළින් හඳුනා-ගත හැකි ය. දේශීය සම්ප්‍රදාය තුළ කාන්තාව හා ජනකවිය අතර, වූ සබඳතාව සමාජයීය, ආර්ථික, දේශපාලනික හා ආගමික වශයෙන් හඳුනා-ගත හැකි ය. ස්වයංපෝෂිත ආර්ථික රටාවක් තිබූ අතීත ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භය තුළ කාන්තාව ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කළ ආකාරය මෙහෙ ගී මඟින් නිරූපණය වන අවස්ථා අපට හඳුනා-ගත හැකි ය.

ජන කවියා තම අව්‍යාජ කවීත්වය විදහා දැක්වූයේ මහා පාණ්ඩිත්‍යයක් ඇති ව නො වේ. ඒ කවි බොහෝවක් ගැමි ලිය විෂය කොට-ගත් ඒවා ය. තම එදිනෙදා අත්දැකීම් හැඟීම් යනාදිය මුසු ව, ගැමියාට විවිධ වූ අයුරින් ජීවිතයේ දී හමුවන්නා වූ කාන්තා චරිත පාදක ව ඔවුහු ජනකවි ගායනා කළ හ. කාව්‍ය වර්ණනාවේ එන කාන්තාව නිරන්තරයෙන් සියුමැලි, සුකුමාල තැනැත්තියක වුවත්, සැබෑ ජීවිතයේ දී කාන්තාවක ගේ ජීවිතය එතරම් ම සුන්දර වූවක් නො වේ. උපතේ සිට මරණය දක්වා ම ගැහැනියට අනේකවිධ දුක්ඛ දෝමනස්සයන්ට මෙන් ම අභියෝගයන්ට ද මුහුණ දීමට සිදු වේ. සමාජයේ ඇතැම් පිරිමින්ට කාන්තාව යනු තම අතකොලුවකි; නොමැතිනම් මුදලට හුවමාරු වන වෙළඳ භාණ්ඩයකි. එය අතීතයේ සිට අද දක්වා ම කාන්තාවට මුහුණ දීමට සිදු වන ප්‍රබල අභියෝගයකි.

ගැහැනිය නා දල්ලක් මෙන් සියුමැලි විය යුතු ය. එහෙත් ඇය නාඳුනන ස්පර්ශයකට හසු වූ නිදිකුම්බාවක් සිය පත්‍ර හකුලා-ගන්නා පරිද්දෙන් නාඳුනන ස්පර්ශයන් ප්‍රතික්ෂේප කළ යුතු ය. ඒ සඳහා වන ධෛර්යය ගැහැනියකට අත්‍යවශ්‍යයෙන් ම පැවතිය යුත්තකි. ගැහැනිය වූ කලී සිය ජීවිතය තුළ විවිධ චරිත නිරූපණය කරන්නියකි. සුකුමාල පෙම්වතිය ගේ සිට පවුලක ජීවන බර සියතට ගැනීමට තරම් ඇය සතු ව පවතින්නේ අන් කිසිවෙකුටත් හිමි නො වූ

ඉමහත් ධෛර්යයකි. ස්වභාවයෙන් ම ශෘංගාරාත්මක හැඟීම් දනවන කාන්තාව සිය රුහිරු සහ දහඩිය තම පවුල වෙනුවෙන් වගුරන ආකාරය ද ජනකවිවල යටි පෙළ අරුත් විවරණය කිරීමේ දී දැකිය හැකි වේ. එහෙත් ජන කවියා එහි දී ද කාන්තාව සතු සුන්දරත්වය තුළින් මතුවන ශෘංගාරාත්මක හැඟීම් දනවෙන පරිද්දෙන් කවිය පබදින්නට සමත් ව ඇත.

**ප්‍රේමය / රාගය සහ කාන්තාව**

සමාජයක සහජීවනය පවත්වා-ගැනීම උදෙසා ඒ ඒ සමාජවල ජීවත් වන මිනිසා ඔවුනොවුනට ප්‍රේම කළ යුතු ය. එය සමාජ මට්ටමකට හෝ තරාතිරමකට සීමා නො වේ. ඒ අතරින් ද ස්ත්‍රී-පුරුෂ ප්‍රේමය විශේෂ වැදගත් කමක් උසුලයි. ජන කවියා ද මෙකී ප්‍රේමය මහත් ඉහළින් වර්ණනා කොට තිබේ. ජනකවි බොහෝවක් ම මෙකී ප්‍රේමය හා රාගය පසුබිම් කර-ගෙන නිර්මාණ වී ඇත. ජනයා තම සිතෙහි උපන් සිතුවිලි ප්‍රකාශනයට ගැයූ මෙම ජන කවි තුළ ප්‍රේමය, රාගය වැනි තම සිත් තුළ උපදින්නා වූ සිතුවිලි කවියට නැඟුනේ නිසර්ගයෙනි. තම සිත් ගත් තරුණිය කෙරෙහි උපන් ප්‍රේමය ඇය වෙත නොවළහා පැවසීමට අතීත ගැමියෝ මෙම ජන කවිය උපයෝගී කර-ගත් හ. මෙම ප්‍රේමණීය සහ රාගික කවි බොහෝවක් නිර්මාණය වූයේ යෞවන කාන්තාව, එසේත් නැතිනම් තරුණිය වස්තු විෂය කර-ගෙන ය. ප්‍රේමය පැවසීමට මෙන් ම ප්‍රේමය අහිමි වීමේ දුක පැවසීමට ද පැරැන්නන් මෙම ජනකවිය උපයෝග කර-ගෙන ඇත.

**ප්‍රේමය**

කවියා භාෂාව උපයෝගී කොට-ගෙන තම නිර්මාණය ඉදිරිපත් කරයි. එම නිර්මාණයට පාදක වන්නේ අනුභූතිය යි. භාෂාව උසස් අයුරින් හසුරුවා-ගනිමින් රස නිෂ්පත්තියෙන් වින්දනයත්, වින්දනයෙන් පරමානන්දයත්, පරමානන්දයෙන් ප්‍රඥාවත් යන පියවර කරා සහෘදයා රැගෙන යන ප්‍රවාහය වන්නේ මෙම අපූර්ව ලෙස නිර්මාණය කර ඉදිරිපත් කෙරෙන අනුභූතී යි. සම්භාව්‍ය කාව්‍යයන් මගින් අප බලාපොරොත්තු වන, මෙම ඉෂ්ටාර්ථය, ගැමි හදවතේ උපන් සියුම් අනුභූති

තමා ජීවත් වන පරිසරයෙන් පෝෂිත වූ ගැමි වහරෙන් ඔපවත් කොට, සහෘදයා තුළ රසයත්, සුවයත්, නැණසත් අවධි කරන්නට ද ජනකවිය එක සේ සමත් වෙයි. එමෙන් ම අද්‍යතනයේ ද ක්‍රියාවාචී ශබ්ද පාවිච්චි කරමින්, එක ම ගෙදර කාමර දෙකක වෙසෙන පෙම්වතාගේත්, පෙම්වතියගේත් අන්තර්පුද්ගල සංනිවේදනය සංයමයෙන් යුක්ත ව යොදා-ගනිමින් නිර්මාණය වූ පහත ජනකවිය ආදරයේ උන්මාදය සහිත ශෘංගාරයක් උද්දීපනය කරයි.

පීරන්නේ වරල යන්න ද          පන්සලට
තෝරන්නෙ වළලු දෙන්න ද       සල්පිලට
කාරන්නෙ එන්න හිතිල ද මං        ලඟට
නෑ දෙන්නෙ දුකක් රන් කඳ යන්     ගමට  (වීරසුන්දර, 2014, පි.50)

ඉතාමත් සංයමයෙන් යුක්ත ව ගැමි සංස්කෘතියක් තුළ පැවති හික්මීම හා චර්යාවන්ගෙන් යුක්ත ව, තමා ගේ තීව්‍ර ආදරය ප්‍රකාශ කරන්නේ ”නෑ දෙන්නෙ දුකක් රන් කඳ යන් ගමට” යනුවෙන් පැවසීමෙනි. ප්‍රේමය තේමා කර-ගත් ජන කවි පහත දැක්වේ.

වැව් ඉස්මත්තේ හේනක් කොටලා          යසට
වපුරා කුරක්කන් පැසෙනා විට            රුවට
අටු කොටු වපුරලා අග හිඟ       නොවන්නට
කැන්දා එමි නගෝ නුඹ මාගේ           පැලට (අමරසේකර, 1996, පි.83)

කැකුළු තනේ දුටු දා සිට බැඳුණු     සෙනේ
මකුළු වනේ තොපිවත් සිලිඳු දැල්    ගෙනේ
බමරිඳු නේ තොපිවත් රොනට ගිය  තැනේ
මුගුණු මල් රේණු පුසුබයි කැකුළු       තනේ   (වීරසුන්දර, 2014, පි.84)

වනන්තරේ වන සපුමල් පිපීයන්
නිරන්තරේ තිලි වැස්සට තෙමීයන්
පුංචි බඳට පෙති ගෝමර ඉසීයන්
ටිකිරි මැණිකෙ මට හීනෙන් පෙනීයන් (වීරසුන්දර, 2014, පි.88)

ආවෙමි ළඳේ නුඹ දැක ගන්නට සිතිලා
උන්නෙමි ළඳේ වන පඳුරක මුවා වෙලා
දුක්වෙමි ළඳේ දැකගන්නට බැරි වෙලා
යන්නෙමි ළඳේ නුඹ ගිය මග සුසුම් ලලා (දේවමුල්ල, 2002, පි.15)

පුන් සඳේ වුවනවත් නුඹෙ සැමදා ම
රන් බඳේ ඉහුණු ගෝමර පෙති සේ ම
මන් ළඳේ මෙදුක් ඉවසන්නේ කෝම
යන් ළඳේ රටක කාටත් නොකියාම (දේවමුල්ල, 2002, පි.15)

එරිලා මඩේ ඉඳගෙන කරන වද වදේ
තෙමිලා නෙරිය ලෙළදෙති නුඹ ගෙ තුනු ඉගේ
වැටිලා අව්ව සැරබෝය වෙල මැදේ
නැමිලා ලඳේ නොකපන් නුඹෙ කොන්ද රිදේ (සිරිපාල, 2002, පි.134,)

ඉර බලා උනෙමි ඉර ගල වැටෙන තුරා
සඳ බලා උනෙමි සඳ ගල වැටෙන තුරා
මග බලා උනෙමි මල් පොකුරු වැටෙන තුරා

මග බලා උනෙමි මගෙ මැණිකෙ එන තුරා (ලොකුහේවා, 1996, පි.187, කවිය.17)

මා යනකොට වැට මුල්ලේ කපද් දැයි
මා දැකලා දාඩිය පිහ දමද් දැයි
කැකිරි හිනාවෙන් මා දෙස බලද් දැයි
එක හැටි මැණික මගෙ පැලදෙස බලද් දැයි (ලොකුහේවා, 1996, පි.193, කවිය.5)

උඩු අත්තේ පිපුනිය මල බෝරු වෙලා
ගෙඩි නැත්තේ සැම මලට බාල වෙලා
බැඳි ඔස්සේ යන්නේ බමරු කෙල කෙලා
නිඳි නැත්තේ සුදු මැණිකා මතක් වෙලා (ගුණසෝම, 1999, පි.28)

පොතුවිල සිට පානම දෙසැරයක් එනවා
ආවට මොකද ඇඳ උඩ ඉඳලා යනවා
මාමට බයේ මම මොහොකුත් නොකියනවා
හිරේට යතත් නෑනේ නුඹ ගෙනි නවා (ගුණසෝම, 1999, පි.32)

ඇල්ලේ වලල්ලේ ඇල්ලේ සිටින්නේ
ඇල්ලේ වතුර නා මා දෙස බලන්නේ
බෙල්ලෙන් පහළ පෙති ගෝමර ඉසෙන්නේ
කයියෙන් තුරන් වී ළඳුනේ වරෙන්නේ (ගුණසෝම, 1999, පි.36)

අහසට එළිය අහසේ තරු පිපුනාම
මූණට පිරිය පෙති ගෝමර ඉසුනාම
ළඳට පිරිය නුඹ නිතර ම දුටුවාම
ළිඳට වත් ඇවිත් නුඹ මා දුටුවාම (ගුණසෝම, 1999, පි.38)

පීරන්නේ වරල යන්ට ද පන්සලට
තෝරන්නේ වළලු දෙන්ට ද පින්කමට
කාරන්නේ එන්ට සිතිල ද මා ළඟට
නෑ දෙන්නේ යමං රන්කඳ අපෙ ගමට (ගුණසෝම, 1999, පි.39)

ඔබත් ඔතන ඉපනැල්ලේ කර වෙනවා
මමත් මෙතන ඉපනැල්ලේ කර වෙනවා
ඉසේ තිබුණ ලෙන්සුව සුළඟට යනවා
පීඩා බෝයි ළඳුනේ හෙවනට එනවා (බණ්ඩා,සිල්වා, 2002, පි.53, කවිය.240)

පැලේ පැදුර වැස්සට තෙමී තෙමී යේ
වෙලේ ගොයම් සුළඟට වැනි වැනී යේ
කණේ තෝඩු අව්වට දිලි දිලී යේ
කොටේ ළිඳට එනවද සුදු කුමාරි යේ (බණ්ඩා,සිල්වා, 2002, පි.76, කවිය.340)

ඔයේ නම් වතුර යන්නේ ගලා ගෙන
ළිඳේ නම් වතුර එන්නේ වුනා ගෙන
කළේ නම් වතුර බොන්නේ පුරා ගෙන
මගේ නම් ළඳේ ඉන්නේ වඩා ගෙන (බණ්ඩා,සිල්වා, (2002), පි.76, කවිය.343)

අඳුරු කැලේ වල් සිමයේ ඉන්න කොට
නොදුරු කෙනෙක් සිවුපද එවනුව මෙ මට
කිඳුරු හඬක් මෙනි ලස්සන ඇසෙන කොට
සොඳුරු (මගෙ) මැණිකෙ එනවද දැක සැනසෙන්ට (බණ්ඩා,සිල්වා, 2002, පි.75, කවිය.350)

එළිවෙනකොට කිරි දෝගෙන ගෙට එනවා
රෑ වෙනකොට ගවයෝ බැඳ ගෙන එනවා
බඳේ තියෙන ගෝමර ටික දිලි සෙනවා
කිරි මැණිකා නිසා මගෙ ජීවිත දෙනවා (බණ්ඩා,සිල්වා, 2002, පි.76, කවිය.356)

අඳින අඳින සේලේ රැලි ගෙතීයන්
බඳින බඳින කොණ්ඩේ මල් ගෙතීයන්
සිහින් බඳට පෙති ගෝමර ඉසීයන්
බංඩර මැණික මට හීනෙන් පෙනීයන් (බණ්ඩා,සිල්වා, 2002, පි.77, කවිය.359)

ඉර මුසු මුසු ඉර මුසු මුසු ය වාරුන්
සඳ මුසු මුසු සඳ මුසු මුසු ය වාරුන්
කරක තැල්ල කාවින් කොණ්ඩ වාරුන්
අර යන පුංචි මැණිකා එංග වාරුන් (බණ්ඩා,සිල්වා, 2002, පි.77, කවිය.360)

රන්කඳ ළැමද පුන්සඳ මඬලක් වාගේ
වෙන්කර දැම්මට හතුරෝ වැඩිය මගේ
තද කර කුසේ ඇවිළෙන ගිනි වැඩිය මගේ
රහසේ බැඳි උඹට ආලය වැඩිය මගේ (බණ්ඩා,සිල්වා, 2002, පි.77, කවිය.362)

දෑත සොඳයි බත් උයවා ගෙන කන්ට
මුහුණ සොඳයි දහවල් බල බල ඉන්ට
දෙපය සොඳයි කඩිසර ගමනින් යන්ට
මගෙ ලිය සොඳයි සබයක සිටුවා ගන්ට (බණ්ඩා,සිල්වා, 2002, පි.78, කවිය.368)

පහළ මංකඩින් එනවා පෙනෙන්නා

පුල්ලි පුල්ලි ඉර හොස්සට වැටෙන්නා

සල්ලි සල්ලි ඇඟ ගෝමර ඉසෙන්නා

උක්කු මැණිකෙ දුටුවම ගිනි නිවෙන්නා (බණ්ඩා,සිල්වා, 2002, පි.85, කවිය.423)

**රාගය**

ඉණ රැළි රැළි ඉණ රැළි රැළි බුරුලි නගේ

ඉස පොකුරැළි ඉස පොකුරැළි අවුලි නගේ

මුහුණේ තිබුණ හැඩහුරුකම අඩු ය නගේ

නෙළුම් මලට පිනි ඉස්සේ කව්ද නගේ (වීරසුන්දර, 2014, පි.56)

හීන් මැණිකෙ ඉඳලා ගිය කඩුල්ලේ

සීන් කෙන්ද මල් පිපුණයි ඇසිල්ලේ

බාන් වෙලා රෑ තුන්යම මුලුල්ලේ

නිදිනම් හොඳයි මැණිකෙගෙ රස තුරුල්ලේ (ලොකුහේවා, 1999, පි.30)

කුකුළු වනේ හඬලන්නේ එළිවෙන්ට

මකුළු වනේ දැල් ලන්නේ බිජු ලන්ට

බඹ රජුනේ රොන් ගන්නේ පැණි ලන්ට

කැකුළු තනේ රඟ දෙන්නේ අල්ලන්ට (ලොකුහේවා, 1999, පි.31)

බල බලා ළඳුනි නුඹ කොහි යනවාද

ගල ගලා කඳුළු බිම වැහි වහිනවද

මල නෙළා දෙන්න නුඹෙ සිත සැනසේද

රස උරා බොන්න නුඹ ළඳ එනවාද (ලොකුහේවා, 1999, පි.33)

නැනා නුඹත් මා වාගෙද හොරකමට
උඹට වැඩිය මගෙ සොරකම් පළමු සිට
වෙනයම් කෙනෙක් පැවොත් සෙනෙහසක් මට
පාන මුකුළු මදිවෙද රති සැප කුමට (ලොකුහේවා, 1999, පි.33)

ගෝන හමෙත් වන තවුසන් සැතපෙනවා
මූන මලෙත් රන් බඹරා දඟලනවා
පාන නැතත් ගෙයි මැණිකක් බබලනවා
නැනෙ මටත් බත් තියපන් මම එනවා (ජයනෙත්ති, 2001, පි.73

අකුල උඩ නොවෙද මඩු මල පිපෙන්නේ
රැකුල උඩ නොවෙද රස මී බඳින්නේ
මකුළු දැල නොවෙද සුළඟට වැනෙන්නේ
කැකුළු මල නොවෙද මට නං ඔබින්නේ (ජයනෙත්ති, 2001, පි.74)

මතන කැලේ ගිනි වැදිලා උන්නා ය
දෙතන තුළේ නිදි අපතේ යන්නා ය
කොතන ගියත් නුඹ සිහිපත් වෙන්නා ය
කුමන ළඳේ මෙදුකින් පණ යන්නා ය (ජයනෙත්ති, 2001, පි.79)

එගොඩ ගොඩේ මං දෙවටේ යන කලට
තෝඩු දෙකක් පෙනේ පොල වටේ පිට
කැකුළු තනේ හිර නොකරන් පොල් ගසට
කකුල රිදෙයි හිම්හිට බැහැපන් බිමට (ගුණසෝම, 2015, පි.236)

අඳුරු තියෙන තැන අලියා ලගින් නේ
පඳුරු තල තලයි ඌ ගමනේ යන් නේ
කිඳුරු නාදයෙන් පැටියන් රකින් නේ
මදුරු මල් සුවඳ තන එන ළඳුන් නේ (ලොකුහේවා, 1996, පි.187)

කුංචාලියන් ගේ තන කැකුළු දුටුවිට
කංසා බීපු මත් ගතියක් මගෙ ඇඟට
වංචාමාන දුන්නොත් සිතු ලසට
සංකා වෙමි ළඳේ හිස සිට දෙ පතුලට (ගුණසෝම, 1999, පි.32)

දොඩම් විතර ලැම පීදී එන කලට
බැලුම් බෝය රතු පිරිමින් දකින කොට
පුළුන් රැලක බර නැත පුරුදු වෙන කොට
ඉඩක් ටිකක් දෙනව ද පැදුරු කොන කට (ගුණසෝම, 1999, පි.34)

ඇති නමුත් වරද තමුසෙගෙ මා නමට
දිය නමුත් පිහිට වෙයි පුලුවන් දුරට
ගලක්වත් පැලෙයි මටවන් සෝ දුකට
විකුණතොත් ගනිමි පියයුරු දෙක රුපියලකට (ගුණසෝම, 1999, පි.61)

කුරක්කන් රුසිරු රුසිරු කුරු දෙතනේ
මලක්කන් සේම ඇවිදින් තිබෙයි තනේ
නරක්කන් මෙහෙම නොකියන් මට ළඳුනේ
කුරක්කන් තදින් නොකොටන් වැටෙයි තනේ (බණ්ඩා,සිල්වා, 2002, පි.51, කවිය.225)

කරලේ පැහුණු සේ මයි මල් බොල් නැතිව
වරලේ උනා බැන්දයි ඔහු ඇද නැතිව
පුරබලේ සොඳයි යාමට බය නැතිව
කරුවලේ වරෙන් සුරතල් මා සිහිව (බණ්ඩා,සිල්වා, 2002, පි.78, කවිය.371)

ඉඳ මරගල ඉඳ මරගල ළඳේයා

එදා දුන්නු දළු බුලතේ රසේයා

කපුරු ලා බුලත් කෑ කට මෙසේයා

ඇවිත් යන්න වර ළඳ මම පැලේයා (බණ්ඩා,සිල්වා, 2002, පි.78, කවිය.372)

සඳේ ලප ලෙසින් අප දනසැර ඉන්ට

කඳේ පිපුණ මල සේ සෙනෙහේ වෙන්ට

ඇඳේ ඉඳන් ආදර බස් තෙපලන්ට

ළඳේ මෙනුඹ කිය මට දවසක එන්ට (බණ්ඩා,සිල්වා, 2002, පි.89, කවිය.439)

හිතට වත් පුරුදු අපි දෙන්නයි ළමයා

නෙතට වත් නින්ද නැත රෑ තුන් යමයා

බඳට වත් අතක් දැම්මොත් සිත සැනයා

පැලට වත් ඇවිත් මම දැකපන් ළමයා (බණ්ඩා,සිල්වා, 2002, පි.79, කවිය.373)

තන වට මට ඇද්ද ගනරන් කුඹු සරිය

ඉණ වට රතු රෙද්ද ඇඳ නොතබා නෙරිය

මන වඩවන ලද්ද යව්වන කත මරිය

වෙන කතකුට ඇද්ද මම තිට ඇති පිරිය (බණ්ඩා,සිල්වා, 2002, පි.81, කවිය.389)

**අහිමි ප්‍රේමය**

කුරක්නක් කපයි අඹරයි අපේ එකී

හැළිය මුවාවේ ඉඳගෙන බෙදන එකී

තලප ටික කන්ට හොඳි ටික නොදෙන එකී

ඊයේ පලච්චයි මගේ ළඟ උන්නු එකී (ලොකුහේවා, 1996, පි.192, කවිය.2)

පාන් වැටිය සේ ඇවිලෙන කුසේ යට
ජේන් නෝනේ නුඹ ගැන හරි දුකේ මට
නාන්නට එනවා නම් ළිඳ ළඟට
හීන්හාමි අත එවපන් ලියුම මට (ගුණසෝම, 1999, පි.32)

රිදී නැන්දේ නුඹ දස අත දිලිසෙනවා
බැඳි කොණ්ඩේ රණ ගිරවෙක් පැණි බොනවා
නිසි නින්දේ ලොව හැමටම මන දෙනවා
රිදී නැන්දේ මුර ඇරුණම මම එනවා (වීරසුන්දර, 2014, පි.95)

නීල කොබෙයි ඉඳගෙන ගී ගයන්නේ
පහළ පාළු ගසක දිවි ගෙවන්නේ
බාල කාලේ මගෙ සිහියට නැගෙන්නේ
ඇයිද ළඳේ නුඹ පිටු දකින්නේ (ගුණසෝම, 1999, පි.35)

දෑත පුරා රන් වළලුත් දැම්ම රගේ
ඇඟිලි පුරා මුදු ස්වරන් කරපු රගේ
කන් දෙක පුරා මිණි බරණත් එල්ලු රගේ
යනවද ළඳේ මට නොකියා වෙන දීගේ (ගුණසෝම, 1999, පි.37)

වරකට දෙන වදන් වරකට වලකිනවා
නුඹ මට පොරණ කීබස් දැන් සිහිවෙනවා
නුඹ මට කරපු හොඳ සැම සුළඟට යනවා
එලොවට පව් නැද්ද ළඳ මට දුක දෙනවා (ගුණසෝම, 1999, පි.37)

සිත් නැළවියේ නුඹ හීනෙන් පෙනේ මට
නෙත් වල ගියේ තාමත් උණු කඳුල කැට
අත හැර ගියේ මගෙ ජාතියෙ පෙර පවට
රත්තරං ලියේ බැහැ නුඹ නො දකින්ට (ගුණසෝම, 1999, පි.52)

ඉරට ඉඳුල් ඉරමුදුනෙන් ගිරව් ගියා
සඳට ඉඳුල් සඳමුදුනෙන් රාහු ගියා
මලට ඉඳුල් මල් මුදුනෙන් බඹරු ගියා
අපට ඉඳුල් රන් එතනා දීග ගියා (බණ්ඩා,සිල්වා, 2002, පි.85, කවිය.416

**අසම්මත ප්‍රේමය**

සමහරු විවාහක වුව ද අන් ස්ත්‍රීන් ඇසුරු කිරීමත් සොර අඹුවක් තබාගැනීමත් සිදු වේ. එම සිරිත කවියා මෙසේ ඉදිරිපත් කරයි.

අල්ලාගෙන නෙරිය අතකින් කින්ද නගේ
වසාගෙන දෙතන සළුපොට කින්ද නගේ
හිමියෙක් නැති ගමන් යන්නේ කින්ද නගේ
අම්බලමේ පොඩියක් නවතින්න නගේ (අමරසේකර, 1996, පි.80)

එසේ ම මෙම ඉල්ලීමට පිළිතුරක් සපයන කාන්තාව තමාට සැමියෙකු සිටින බැවින් අන් හිමි නොපතන බවත්, බාල මස්සිනා පස්සෙන් එන නිසා තමන්ට තනියක් නැති බවත් කියයි.

අල්ලාගෙන නෙරිය මඬ තැවරෙන හින්දා
වසාගෙන දෙතන බිලිඳුගෙ කිරි හන්දා
බාල මස්සිනා පස්සෙන් එන හන්දා
යන්නම් අයියණ්ඩි මගේ ගම රට දුර හන්දා (ගුණසෝම,1999, පි.37)

දුර බැහැරක ගොස් බඩු පොදි භාර දී නැවත සැහැල්ලුවෙන් ගමට යන කරත්තකරු, අම්බලමේ බංකුව මත සිටින ළඳක දකියි. ඇගේ පිට දිගට වැහෙන ගෝමර රන් සළුවක් මෙනි. ඇය දැකීමෙන් ඔහු තුළ ශෘංගාර ජනක කවි සිතුවිල්ලක් පහළ වෙයි. ''මමත් තනිකඩ දිවියක් ගෙවන නාඹර තරුණයෙක්,

ඉතින් අප දෙදෙනා ගේ එක්වීම සඳහා මා නුසුදුසු වන්නේ කෙසේ ද? චන්ද්‍රයා ඈත අහසේ සිට අපට (පෙම්වතුන්ට) කරන මේ ආරාධනය ඉවත ලන්නේ කෙසේ ද?'' ඔවුන් දෙදෙනා සම්භෝගයෙන් සැනසුණු අයුරුත් එකිනෙකා වෙන්වීමෙන් පසු කරත්තකරු පිටත් වන විට හඳ මුදුනේ බව දැක්වීම මඟින් එකිනෙකා විඳි ප්‍රීති ප්‍රමෝදයේ සටහන් තවමත් සිත්හි පවතින බවත් ව්‍යංග්‍යයෙන් කියයි.

අම්බලන් පෝරු මත සිටිනා ළඳුනේ
රන්සලින් ලෙසට ගෝමර පිට දිලුනේ
මං බොලන් එහෙම දේකට නැත අඟුනේ
පන්තිලෙන් පිටත් වෙනකොට හඳ මුදුනේ (අමරසේකර,1996)

හේනේ පැලට ගිය ගොවියාට මහත් අකරතැබ්බයක් සිදු වේ. ඔහු කිසියම් හේතුවකට පැලෙන් ඉවත් ව ගියේ ය. මුළු රැයක් ම තමා සිත් ගත් ළඳක හා වාසය කොට, වයිතාලේ නැවත පැල වෙත පැමිණි ගොවියාට, දෙවියන් සිහිවුණි. පැලේ පැදුර හොරු අරගෙන ගොස් ය. හැන්දෑයාමේ පැලට ගෙනා පැදුර නැතිව නැවත ගෙදර යන්නේ කෙසේ ද? තමා රාත්‍රියේ ගිය තහනම් ගමන් බිරිඳ දතහොත් නිවස එක ම කල කෝලාහලයක් වනු ඇත. ඉතින් දෙවියනේ අනේ මගේ පැදුර දෙන්න. ඔහු හොරෙකු නො වේ. මා මේ විපතින් අත් මුදවා-දෙන මගේ නෑයෙක් වන්නේ ය. ගැමි සංස්කෘතියේ පවතින සමහර අංගයන් ජන කවියා දැඩි සංයමයෙන් හා ව්‍යංග්‍යයෙන් ඉදිරිපත් කරන ආකාරය ඉතා මනරම් ය. මේ තත්ත්වය හොඳින් වටහා-ගත් ගැමි ළඳ, සැමියා ගේ පැල් රැකීම ගැන සඳහන් කරන මෙම ජන කවිය අව්‍යාජ ව, සියලු කරුණු සක් සුදක් සේ පැහැදිලි කරයි.

අනේ දෙවියනේ මට වුන වියෝයා
පැලේ පැදුර හොරු අරගෙන ගියෝයා
ගෙදර ගිය කලට අඬ දබර බෝයා
පැදුර දුන් කෙනෙක් මගෙ නෑ සියෝයා

අපේ පිරිමි පැල් යනවා කියාලා
පැලට ගොසින් ගිනි මොළවා තියාලා
රෑට අවුත් අගු ගොමුවල රැක ඉඳලා
උදේට එති පැල් ලැග්ගා කියාලා (තිලකරත්න, 1971, පි.111)

ගැමි ජන ජීවිතයේ අස්සක් මුල්ලක් නෑර ම, තම අණසක යෙද වූ ජන කවියා දුක්ඛ දෝමනස්සයන් මෙන් ම ප්‍රීති ප්‍රමෝදයන් ද, ප්‍රබලතා සහ දුබලතා ද, එක සේ හෙළි පෙහෙළි කරන්නට තරම් අව්‍යාජ වීම ජන කවියේ නිර්මාණ පරාසය තවත් පුළුල් කරන්නකි.

අවස්ථා නිරූපණය අතින් ද, ජන කවියා ඉතා ප්‍රබල ස්ථානයක සිටින බව පහත සඳහන් ජන කවිය මොනවට කියා පායි.

මිණි මිණි පොදේ ගන අඳුරේ කන මදුරූ
බල්ලෙක් ඉඳ බුරයි ඌගේ ගති නපුරූ
කෙල්ලෙක් ඉඳන් දොර නාරියි ඇගෙ වියරූ
මල්ලක් කදුරු කන්නෙමි විගස දොර හරූ (පතිරණ, 1987, පි.233)

ගත දැවෙන සීතලත්, පුංචි වැහි පොදත්, උණුසුම් වීමට එන්නට මට කරන ඇරයුමයි. සීත අඳුර රාගයේ මිත්‍රයා ය. එහෙත් මදුරුවන් ගේ විත ශරීරයට දුක් දෙයි. එපමණක් නො ව හොර රහසේ ම මේ පැමිණි ගමනට බල්ලෙක් හතුරුකම් කරයි. මෙසේ තරුණයෙකු අයාලේ ගිය ගමනක් ඉතා උචිත අවස්ථා නිරූපණයකින් කවියා අප වෙත ඉදිරිපත් කරන මනෝ චිත්‍රය විසිතුරු ය. ප්‍රේමයත්, රාගයත්, තහනම් ආදරයත්, ඊට උචිත බස් වහරින් හා අවස්ථා නිරූපණයෙන් වෙන් වෙන් ව කවියා ඉදිරිපත් කරන ආකාරය, ජනකවියේ නිර්මාණාත්මක පක්ෂය විමසීමේ දී අප ගේ සැලකිල්ලට බඳුන් විය යුතු ය. ආවේගයක් ප්‍රකාශ කිරීමේ දී ජන කවියා ගැමි සංස්කෘතියේ සැබෑ ස්වරූපය හා වහර කදිමට යොදා-ගනියි.

අනුන් කතේ මම දුක් ගන්නේ කුමට
අනුන් අතේ ඇති විදුලිය සිහි දැනට
උසුලා ගන්ට බැරි දුක්දෙන්නේ කුමට
වරෙන් ළඳේ වෙන්වී නුඹ මා නමට (ගුණසෝම, 1999, පි.37)

අඬ අඬා ළඳුනි නුඹ කොහි යනවාද
ගල ගලා කඳුළු බිම වා සිඳවාද
මල නෙලාදෙන්ට සිත සැන සෙනවාද
දොඩ දොඩා ඉන්ට දවසක එනවාද (ගුණසෝම, 1999, පි.38)

කුකුලු හඩා වට එළිවෙන්නා එතනා
මුකුළු සිනාවට එළියෙන් පාන සිනා
කැකුළු මල වට බඹරුන් ඇදෙන ලෙසිනා
ඉතිං මෙමට යන්නට දොර ඇරපන් එතනා (ගුණසෝම, (1999), පි.34)

මුතු මැණිකා කාටත් හොඳ ගුණ කාරි
වැස්ස පින්න නොතකා රති කෙළි කාරි
විස්ස පිරුණත් කොල්ලෙක් අත නාරි
පස්ස නුඹේ යකඩෙන් තැනුවද බාරි (ගුණසෝම, (1999), පි.60)

වියේ වියේ ඔබ කොතනින් ගෙනා වියේ
කනබවැවේ ගල මුදුනෙන් ගෙනා වියේ
මගෙ නෑනා මා සමඟයි දීග ගියේ
එනවද ළඳේ මා සමගින් මූද දියේ (බණ්ඩා,සිල්වා, 2002, පි.78, කවිය.367)

**විවාහය (නෑනා මස්සිනා)**

සිංහල කුල කාන්තාවක නම් ඇය පතිව්‍රතා ධර්මය රැකිය යුතු ය. **පත්තිනි දේවිය** වන්දනා කරන, පතිවත රකින අය වර්තමාන සාමාජයේ ද දක්නට ලැබේ. සමාජය එවැනි කතුන් උසස් තත්ත්වයේ ලා සලකයි.

පින්වත් උතුම් ගුණවත් ස්වාමි බාරිට
අන් හිමියන් පිළිකුල් ගැරඬින් ලෙසට
තම හිමි දෙව්ලොවේ සුර කුමරකු ලෙසට
පතිවත රකියි බාරිය ස්වාමි මෙලෙසට (තිලකරත්න, 1971, පි.116)

සිංහල සමාජයේ විවාහය කෙරෙහි බලපෑ ඥාති සම්බන්ධතා සැලකිල්ලට ගත් කල නෑ වාසිය කෙරෙහි ප්‍රමුඛතාව හිමි විය. නෑ වාසිය විමසා-බැලීමේ දී විවාහයට ඉතා සුදුසු ලෙස සලකන ලද්දේ නැන්දා ගේ දුව වන නෑනා විවාහ කර-ගැනීම ය. ඊට බලපෑ සමාජ හා ආර්ථික හේතු සාධක විමසා-බැලීමේ දී සිංහල සමාජය කුල පදනමක් මත සංවිධානය වී පැවතීමත්, කුල මගින් උරුම වූ රැකියා වෘත්තීන් පරම්පරාගත ව පවත්වා-ගෙන යාමේ අවශ්‍යතා මත විවාහයේ දී මේ සම්බන්ධතාව සැලකූ බව විද්‍යමාන වන කරුණකි. කවර නෑනා මස්සිනා කෙනෙකු වුව ද සමාන කුලයකට අයත් වන බැවින් කුලයෙන් උරුම වූ භාණ්ඩ නිෂ්පාදනය හෝ සේවාව අඛණ්ඩ ව පවත්වා-ගෙන යාමට මේ විවාහ ක්‍රමයෙන් ඉඩ සැලසිණ.

සිංහල සමාජයේ තරුණයෙකුට විවාහ කර ගත හැකි හොඳ ම තැනැත්තිය වූයේ නැන්දා ගේ දුව වූ නෑනා ය.

සාගතේ මොට ද මිනිහෙක් සතෙක් නැති
මාවතේ මොට ද ගමනට ඉඩක් නැති
රාමතේ මොට ද මග පෙරලුමක් නැති
ජීවිතයේ මොට ද නෑනා කෙනෙක් නැති (තිලකරත්න, 1971, පි.107)

වැසි දිය අයිති ගං හෝ ඇල　　සමුදුරට යි
මල් පැණි අයිති වට ගුමු දෙන　　බමරාට යි
මීරා අයිති කිතුලේ කල　　වැද්දාට යි
නෑනා අයිති කාට ද　　මස්සිනාට යි (අමරසේකර, 1996, පි.111)

මෙබඳු ජනකවි පාරම්පරික අයිතිවාසිකම ප්‍රකට කරයි. නෑනා-මස්සිනා විවාහය ඉපැරණි ඉන්දියානු සංස්ථාවකි. සිද්ධාර්ථ කුමාරු ගේ පවුල වූ ශාක්‍යයන් සහ යසෝදරා ගේ පවුල වූ කෝලීය වංශිකයන් අතර පරම්පරා ගණනාවක් මුළුල්ලේ ආවාහ විවාහ සිදු වුණි. මෙම නෑකමට යෙදෙන ඇවැස්ස (සංස්කෘතඃ අවශ්‍ය) යන වචනයෙහි තේරුම වූ අවශ්‍ය යන පදයෙන් පැහැදිලි වන්නේ යමෙකුට ඇවැස්ස නෑනා හෝ මස්සිනා විවාහ කර-ගැනීමට ඇති අවසරය පමණක් නො ව එසේ කිරීමට ද හෙතෙම බැඳී-සිටින බවත් ය. පිටස්තර කෙනෙකු සමඟ ස්ත්‍රියක විවාහ වන විට එම මනාලයා ඇගේ ඇවැස්ස මස්සිනාට බුලත් අතක් දී අවසර ලබා-ගැනීමේ (කඩුලු බුලත්) සිරිත් මෙහි පැවැතියේ ද පෙර කී දෘඪ සම්බන්ධතාව හේතුවෙනි.

නාග ලොවේ වෙද බුලත්　　උපන්නේ
ගසේ ගිහින් වද බුලත්　　කඩන්නේ
ඇවැස්ස මස්සිනා මමයි　　බොලන්නේ
කඩුලු බුලත් ටික දීලයි　　යන්නේ (ඩයස්, 2009, පි.383)

**ව්‍යාභිචාරය**

කාම සම්භෝගය මිනිස් ප්‍රජාව ගේ පැවැත්ම සඳහා අවශ්‍ය සාධනීය සම්මතයකි. මූලික මිනිස් අවශ්‍යතාවක් මෙන් ම ශික්ෂාකාමී සමාජයක පැවැත්මට අදාල කාම රතිය පැරැන්නන් විසින් සලකනු ලැබූයේ සම්පතක් ලෙසට ය. යුවතියක ගේ හාව භාව ලීලා සහිත ලාලිත්‍යයෙන් යමෙකු ගේ මනසෙහි සසල බවක් නො වේ නම් එක්කෝ ඔහු භාවනා යෝගියෙකු, නැතිනම් සිවුපාවෙකු

සැලකිණ. ස්ත්‍රී පුරුෂ කාමරතිය පිළිබඳ කෙරෙන සම්භාවනාවක් මතු සඳහන් ශ්ලෝකයෙන් ප්‍රකාශිත ය.

''සුභාෂිතෙන ගීතෙන - යුවතීනාංච ලීලයා
මනො න හිද්‍යතෙ යස්‍ය - ස යෝගීහවාථවා පශුං''

අසම්මතය වන්නේ අයෝග්‍ය කාමය යි. අයෝග්‍ය කාමය ඒ ඒ සමාජ සංස්කෘතීන් විසින් සීමා පමුණුවා වෙන් කොට-ගනු ලැබේ. පොදු නීතියට හෝ සමාජ සම්මතයට අනුව නොගැළපෙන කාමය අසම්මතය වශයෙන් සලකනු ලැබේ. සිංහල සංස්කෘතියෙහි කාමාස්වාදය පිළිබඳ පොදු සම්මත ගණනාවක් පවතී (ඩයස්, 2009). ඒ ජාති, කුල, ගෝත්‍ර හා වයස් සීමා ආදී වශයෙනි. අතීතයේ දී ජාති, කුල, ගෝත්‍ර හා වයස් සීමා බාධා වශයෙන් පැවතිය ද අද්‍යතනයේ එය එතරම් සැලකිල්ලට භාජනය නො වේ. කුලගෝත්‍ර ප්‍රශ්නය ඉස්මතු වීමෙන් දුටුගැමුණු පුත් සාලිය කුමරුට රාජ්‍යය අහිමි විය. පිරිහුණු මහල්ලා තරුණියක සරණපාවා නොගත යුතු බව පරාභව සූත්‍රයේ කියැවේ.

''අතීත යොබ්බනො පොසො - ආනේති තිම්බරුත්ථිනිං
තස්සා ඉස්සා න සුපති - තං පරාභවතෝ මුඛං''

එබඳු විවාහ විසක් ශරීරගත කර-ගැනීමක් බඳු යැ යි ඍෂි භාෂිතයෙහි; වෘද්ධස්‍ය තරුණී විෂම් යනුවෙන් කියැවේ. මහප්පා, බාප්පා ආදීන් ගේ දියණියන් විවාහ කර-ගැනීමට කිසි ඉඩක් සිංහල සමාජයෙහි නොලැබිණි. නීති නිඝණ්ඩුවේ එබඳු විවාහයන් හඳුන්වා ඇත්තේ අවචාරිත්‍ර සරණය වශයෙනි. එසේ ම ජාති ජාති භින්නක සරණය වශයෙන් ද හඳුන්වා ඇත. මෙබඳු විවාහයකින් උපන් දරුවන් අවජාතක දරුවන් ලෙස අර්ථ ගන්වා ඇත.

නෑනා මස්සිනා සම්බන්ධතාව හැරුණු කොට ජාති කුල ගෝත්‍ර විමසමින් සමාන තරාතිරමේ තරුණයෙකුට දියණියක විවාහ කර-දීම ද සිංහල සමාජයේ අඛණ්ඩ ව පැවත ආ සිරිතකි. මේ සම්මතය බිඳ හෙළුව ද අසම්මතයා අතුරෙන්

ව්‍යාභිචාරී සම්බන්ධතා විශේෂ කොට දැක්විය හැකි ය. ව්‍යාභිචාරී සම්බන්ධතා යන්නෙන් තහනම් හෝ ලේ නෑයින් අතර ඇති වන ලිංගික සම්බන්ධතා අදහස් කෙරේ. මේ පිළිබඳ තොරතුරු හඳුනා-ගැනීමේ දී මුඛ්‍ය මූලාශ්‍රය වන්නේ ජනශ්‍රැතිය යි. සමාජ නියම බිඳහෙළන මෙබඳු සම්බන්ධතා පිළිබඳ ව සිංහල සමාජයේ පැවැති නොකැමැත්ත ඔවුන් ගේ මුවින් ගිලිහුණු අප්‍රකට ජන කවි ඇසුරින් හඳුනා-ගත හැකි ය. මේවා අප්‍රකට ව පවතින්නේ ද ඒ පිළිබඳ සිංහල සමාජය දක්වන පිළිකුල හා බිය හේතුවෙනි. නෑනා මස්සිනා බඳු සමාජ සම්මත ප්‍රේම සම්බන්ධතා පිළිබඳ දක්වන ආකල්පය හේතු කොට-ගෙන එකී ජන නිර්මාණ මුඛ පරම්පරාගත ව ජනප්‍රිය වුවත් ව්‍යාභිචාරී සම්බන්ධතා එසේ මුළු මහත් සමාජය පුරා මුඛ පරම්පරාගත ව ජනප්‍රිය ව නො පවතී (ඩයස්, 2009).

එක් අප්‍රකට ජනකවියකු විසින් පීතෘ දුහිතෘ ලිංගික සම්බන්ධතාවක් මෙසේ අනාවරණය කෙරේ. පිලේ නම් වූ ඔහු ඉනි කැපීමට කැළයට ගියේ සිය දියණිය සමඟ ය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ඔහුට දාව ඇගේ කුසේ දරුවකු පිළිසිඳ ගැනීම ය. මේ සිදුවීමෙන් සිය පවුලට වන අවනම්බුව මකාලීමට ඔහු කළේ ඇය මරිස නම් වූ තැනැත්තෙකුට විවාහ කර-දීම ය. පද්‍යයේ දෙ වන පේළියේ දැක්වෙන උපමාවෙන් එම ක්‍රියාව වසා ලිය නොහැක්කක් ලෙස තදබල දෝෂදර්ශනයට ලක් කෙරේ. මේ සිදු වීම හේතු කොට-ගෙන කවියා තමන් හා ඔවුන් අතර පැවති නෑකම ද කෙළවර වූ බව අවධාරණය කරයි. මෙයින් ඇඟවෙන කරුණ වන්නේ මෙබඳු තැනැත්තන් සමග සමාජ සම්බන්ධතා පැවැත්වීමට සිංහල සමාජයේ කිසිවකුත් ප්‍රියමනාප නොවූ බව යි.

කැලේ ඉනි කැපීමේ ගොස් දූව     බඩ කර
ගලේ පැහැරූ බළලෙක් ගූ වසන     යුර
කුලේ වසන්නට මරිසට දුන් එ     හැර
පිලේ උඹලාපෙ නෑකම් දුරින්     දුර (ඩයස්, 2009, පි.385)

සමාජ සාරධර්මයන්ට පටහැනි අසම්මත චර්යාවන් වුව ද ජනතාව වෙත ද ගෙන-යන කලාත්මක වාහකයා ලෙස ජනකවිය හැඳින්විය හැකි ය. ජුගුප්සාජනක සිද්ධීන් වුව ද සමාජයට පණිවුඩයක් ගෙන-ඒමේ අරමුණින් ජන කවිය මෙසේ ජනතාවට ඉදිරිපත් කොට ඇත. එක්තරා ජනකවියක කියවෙන ලෙසින් කිතුලානේ දර ඇති බව මව පවසයි. එහෙත් එහි දර නැති බව දියණිය කියයි. ඒ කිසියම් අදහසක් සිතේ ඇති ව ය. අම්මා ඇගේ වදන් නාසා දර සෙවීම සඳහා කිතුලානට යයි. පියාත් දුවත් ගෙදර තනිවෙති. එහි දී රාග චේතනා හට ගත් පියා දියණිය ගේ අතින් අල්ලයි. ඇය වහා මවට මේ සිද්ධිය සත්තක සිද්ධියක් ලෙස දන්වා සිටී. කළ යුතු කිසිවක් නැත්තෙන් බීපු කිරිවල පව් අරවා-දෙන ලෙස මවගෙන් ඇයැද සිටී.

කිතුලානේ දර තියෙතෙයි කිවු අම්මා
කිතුලානේ දර නැතිද ලු මගෙ අම්මා
සත්තක පියා අත ඇල්ලුවයි අම්මා
බීපු කිරේ පව් ඇරපන් මගෙ අම්මා (ඩයස්, 2009, පි.389)

මතු සඳහන් කවියෙන් කියවෙන්නේ ද ඉහත කී පද්‍යයෙහි දක්වන ලද අර්ථයට සමාන වූ අදහසකි.

කාත් නැති අපට ඕවා හරිද අනේ
මාත් අරන් මගෙ දුව ගත්ත හිමියනේ
ඈත් තමුසෙට දුව නොවෙද දෙවියනේ
ආත්තත් අරන් පළ යන්න ගජමනේ (කවි සඟරාව, 1996, පි.20)

හියු නෙවිල් කවි එකතුවේ එන කිරි මැණිකේට කියු කවි, සහෝදර සහෝදරියන් අතර, වූ ව්‍යාභිචාරී සම්බන්ධතාවක් අනාවරණය කරයි.

ගිරි දේවිය ගේ විත්තිය ද මෙබඳු ව්‍යාභිචාරී සම්බන්ධතාවක් පළ කරයි. එය භාරතීය සමාජයෙහි සිදු වූවක් ලෙස දැක්වෙතත්, සිංහල සමාජයේ ශාන්තිකර්ම

හා බැඳී ව්‍යාප්ත ව පවතී. සිංහල සමාජයේ එසේ ව්‍යාප්ත වූයේ ද සමාජයට කිසියම් මගපෙන්වීමකට බව සැලකිය හැකි වේ. දන්ත පුරයෙහි හංසවතී දේවිය දියණියක ප්‍රසූත කළා ය. නැකැත් වේලා බැලූ කල සිය සොහොයුරාට පෙම් බඳින බව අනාවරණය වූයෙන් එය වැළැක්වීම සඳහා බිං ගෙයක් තනවා එහි කිරි මව්වරුන් පන්සියයක් දෙනා සමග ඇය රඳවනු ලැබී ය. ඕ වැඩිවියට පත්වීමත් සමඟ කාමයෙහි ලොල් වූවා ය.

කොයියම් දේ වත් සිදුවන කාරී
අයියත් එක කුස උපන් කුමාරි
දෙයියන්ටත් බැරි නවතනු කාරි
අයියට කල් බැඳ සිටිති කුමාරි (තිලකරත්න, 1971, පි.110)

සිය සොහොයුරාට පෙම් බඳින බව අනාවරණය වූයේ එය වැළැක්වීම සඳහා බිං ගෙයක් තනවා එහි කිරි මව්වරුන් පන්සියයක් දෙනා සමග ඇය රඳවනු ලැබී ය. වැඩිවියට පත්වීමත් සමඟ කාමයෙහි ලොල් වූවා ය.

කල් පසු වී සොළොසට ද පිරිච්චී
මල් මද ගිරි ළද මල්වර වෙච්චී
අල්ප සිතක් මොකවත් නොලැබිච්චී
ලොල්වී කාමෙට සිත ලොල් වෙච්චී (ඩයස්, 2009, පි.386)

වානු බැරිය සිත ළද ගිරි දෙවිට
දේනු හංස පැටි පෙම නුරාවට
පේනු වෙලා එනවා සිත කාමෙට
ගෑනු කිව්ව ගතුවෙන් ද කුමරුට (ඩයස්, 2009, පි.388)

රජක ස්ත්‍රිය අතින් නගා සිටින තැන අසා ගත් කල අසාදත් දළ කුමරු ඇය කරා ගොස් කායික ව එක් විණ. අවසානයේ ඈ සොහොයුරා හා එක්වීමේ වරද වටහා-ගෙන සිය දිවි නසා-ගත්තා ය. අනතුරු ව ඈ ගිරි දේවිය බවට පත් වූවා

ය. සහෝදර සහෝදරියන් අතර ඇති වන ලිංගික සම්බන්ධතා තහනම් කිරීමට ඇති කළා වූ සිරිත්-විරිත් හා සම්බන්ධ යාතු කර්ම බොහෝ සමාජවල දක්නට ලැබේ. දැරිවියක වැඩිවිය පත්වීම හා සම්බන්ධ දෝෂ දූරීකරණයට **කොටහළු යාගය** පැවැත්වීම සිංහල සමාජයේ සිරිත විය. එහි දී ගයන කව්වල ගිරි දේවිය පිළිබඳ පුවත ඇතුළත් ය. ජන කවියා සිදු කළේ තමන් විසින් ඉටු කළ යුතු සමාජ කාර්ය භාරය යි. කාලාන්තරයක් තිස්සේ මුල් බැස-ගත් සමාජ සාරධර්ම කිසිවෙකු උල්ලංඝනය කළේ වී නම්, වහා එම සිදු වීම සමාජගත කොට ඊට එරෙහි මතවාදයක් ඉදිරිපත් කිරීම මෙන් ම, ඉදිරි පරපුරට හඳුන්වා-දීම ද ඔහු තම වගකීම වශයෙන් අර්ථ ගන්වා ඇති බව මින් මනාව හැඟී යන කරුණකි. ඒ අනුව දුරාතීතයේ සිට පැවැත එන ව්‍යාභිචාරී සම්බන්ධතා හා බැඳුණු ජන කවි සිංහල සමාජයට මඟ පෙන්වූ සමාජ චාරිත්‍ර-වාරිත්‍ර හා සාරධර්ම පිළිබඳ පැවැත්ම තහවුරු කළ අගනා සමාජයීය වටිනාකම්වලින් යුතු නිර්මාණ විශේෂයක් ලෙස සඳහන් කළ හැකි ය. කිසියම් සිදු වීමක, අනුභූතියේ ඇති මතුපිට අර්ථය ඉක්මවා සැඟවුණු අරුතක් සහිත ව තම නිර්මාණ බිහි කිරීමට ජන කවියා තුළ ද සහජ කුශලතාවක් ඇත.

**සමාලෝචනය**

ජන කවියා යනු එම සාමාන්‍ය මිනිසා අතර, යම් විශේෂත්වයකින් හෙබි අයෙකු ලෙස හැඳින්විය හැකි ය. මෙම කවියා ගේ සහ සාමාන්‍ය මිනිසා ගේ ඇති එක ම වෙනස්කම නම් කවියා සාමාන්‍ය මිනිසාට වඩා සැණයකින් බාහිර ලෝකයෙහි හැඟීම් අවබෝධ කර-ගැනීම ය. කුණාටුවත්, සූර්යෝදයත්, ඍතු විපර්යාසයත්, වියෝගයත්, සම්ප්‍රයෝගයත්, බලාපොරොත්තුවත්, ආශාවත්, ආදරයත්, දුකත්, සැපත්, කනගාටුවත් යන සෑම දෙයෙහි ම නියම තත්ත්වය සෙසු සියලු දෙනාට ම ප්‍රථම ද, පහසුවෙන් ද අවබෝධ කර-ගෙන තිබෙනුයේ ජන කවියා බව පෙනේ. කවියා ගේ පරමාර්ථය ඒ හැඟීම් සෙසු අයට ද පහසුවෙන් අවබෝධ කර-වීමට නම් කවියා ගේ භාෂාවෙහිත්, සාමාන්‍ය මිනිසා ගේ භාෂාවෙහිත් වෙනසක් නො තිබිය යුතු ය. කවියා තමා වැනි කවීන්ට ම කවි

නිර්මාණ කරන්නෙක් නො වේ. ඔහු කවි ඉදිරිපත් කරන්නේ සමාජයට ය (මීමන, 1963, පි.43).

විදග්ධ සාහිත්‍යයට බලපෑම් ඇති කළ පොදු ජන සාහිත්‍යයේ ප්‍රභේද කිහිපයක් පවතී. එනම් ජනකතා, ජනප්‍රවාද, ප්‍රස්තාව පිරුළු ජන කවි ආදිය යි. මෙයින් ජනකවිය තරම් පොදු ජනයා ගේ හද වැළඳගත් වෙනත් ආකෘතියක් නැති තරම් ය. සෑම තරාතිරමක ම සමාජ ස්ථරයන් තුළ ජනකවියෙන් ලත් ආස්වාදනීය සුබය රැඳී ඇත. මේ අනුව ගැමි සමාජයේ ජන රිද්මය තීව්‍ර අන්දමින් පිළිබිඹු කිරීමේ ලා ජනකවිය සතු ශක්‍යතාව ඉතා ඉහළ ය. ජනතාව අතරින් පෝෂණය වී ඔවුන් ගේ ජීවන රටාවත්, සංවේදීතාවත් සරල ආකෘතියකින් නැවත ඔවුන්ට හිමි කර-දෙන ජනකවියට ඇතැම් ප්‍රබුද්ධ කවියේ පවා නොමැති රස ජනනය කිරීමේ ශක්‍යතාවක් හිමි ය. එසේ වන්නේ පුද්ගල මනස තුළ ම නිරායාසයෙන් ගලා-එන හැඟීම් රසවත් ව ඉදිරිපත් කිරීමත්, එය ඒ අයුරින් ම ස්මරණය කිරීමට හැකි වීමත්, කාව්‍යය ප්‍රකාශනයේ දී ජනිත වන ධ්වනිය හා වාච්‍යාර්ථ අබිබවා ඉස්මතුවන අර්ථ උද්දීපනය හේතුවෙන් රසාස්වාදනය ඉපදවීමත් නිසා ය.

කවි උස් හඬින් ගායනා කළ හැකි ය. බිය, හුදෙකලා බව හා සාංකාව දුරු කර-ගැනීමේ ශක්තියක් එහි ඇති බැවින් ජන කවිය තීව්‍ර ය. සෑම ජනකවියකට ම ආරක්ෂකයා වූයේ ගැමි සමාජය යි. මෙසේ පැවත ආ පොදු ජන සාහිත්‍ය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. එනම්, ජනකවි හා ජනකතා වශයෙනි. මේ අනුව බලන කල ජනකවි, පද්‍ය මුහුණුවරකින් ද, ජනකතා ගද්‍ය මුහුණුවරකින් ද යන දෙයාකාරයෙන් උපත ලබා ඇති බව පෙනී යයි. මෙයින් ජනකවිය ජනකතාවට වඩා පාඨකයා ගේ සිත් සතන් පුබුදු කරවනසුලු ය. පුද්ගල මනස තුළට අනුත්සාහක ව ගලා-එන හැඟීම් සමුදාය රසවත් ව ඉදිරිපත් කිරීම, එය ඒ අයුරින් ස්මරණය කිරීමට හැකි වීම, කවිය ප්‍රකාශ කිරීමේ දී ජනිත වන ධ්වනිය හා වාච්‍යාර්ථය ඉක්මවා පිළිබිඹුවන අර්ථ උද්දීපනය වීම නිසා රසයක් උපදී (ඔරුමාන්කුලම, 1990, පි.10).

ග්‍රාමීය සංගීතය සෑම රටක ම පොදු ජනතාව ගේ සහජ උරුමයකි. ගැමි ගී ගැයීමෙහි හා ඇසීමෙහි ආශාව ඔවුන් තුළ නිසගයෙන් හා සතතින් ම වේ. ඔහු ජීවත්වන සමාජයේ ඕනෑ එපාකම් උඩ ගොඩනැගුණු කලාවක් හෙයින් ලොව ඇති සෑම සංගීතයකට ම වඩා ඔහුට ඔහු ගේ පාරම්පරික ගීය අගනේ ය. ග්‍රාමීය සංගීතය ගැමියා සේ අව්‍යාජ ය; මිශ්‍රිත ආටෝපයන්ගෙන් තොර ය. එසේ ම එය ගැමි සමාජයට ම පොදු ය (මකුලොලුව, 2000, පි. 114). ගැමි ගීයක හෝ ගැමි සංගීතයක දැකිය හැකි ලක්ෂණ කිහිපයකි.

- මුඛ පරම්පරාගත ව පැවතීම
- නිර්මාපකයා හෝ රචකයා නිර්නාමික වීම
- එදිනෙදා ජීවිතයේ කිසියම් කරුණක් වස්තු විෂය කර-ගැනීම
- නිර්මාණය කළ කවි නො ව, නිර්මාණය වූ කවි වීම
- නිර්ව්‍යාජ බව
- සංයමයකින් යුතු වීම
- සංක්ෂිප්ත බව
- කිසියම් කාර්යයකට අදාළ වීම
- පොදු ජනයා විසින් සාමුහික ව පිළි ගැනීම
- පොදු ජනයා ගේ සිතුම් පැතුම්, ඇදහිලි, ජනකතා, ඓතිහාසික සිදුවීම්, ජීවන වෘත්තීන් ජීවිතය පිළිබඳ අත්දැකීම් විශ්වාස ආදි කරුණු ගැමි ගීවලට ප්‍රස්තුත වීම.
- සෞන්දර්යය උද්දීපනය කරවීම
- හිතකර තම වටපිටාවෙන් ගත් උපමා යෙදීම
- අවස්ථා නිරූපණයේ බුහුටි බව

ඉතිහාසයේ ආරම්භ යුගයේ සිට හුවමාරු සංස්කෘතියකට අනුගත වූ මානවයා විවිධ සංක්‍රමණවල දී භාණ්ඩ හුවමාරු කර-ගත්තේ ය. යුදායුධ, වස්ත්‍රාභරණ පමණක් නො ව භාර්යාවන් ද හුවමාරු කර-ගැනීමට පෙලඹිණි. ජන ජීවිතයේ තොරතුරු නිර්ව්‍යාජයෙන්, සංයමයකින් යුතු ව, අවස්ථා නිරූපණය බුහුටි බව හෙළි කරන සාහිත්‍යාංගයක් ලෙස රාගික හා ව්‍යාභිචාරික තේමා කවි සුවිශේෂී ය. සිංහල ගායන ක්ෂේත්‍රය පෝෂණය ඇත්තේ සිංහල ගැමි ජනයා ගේ උපතේ සිට මරණය දක්වා විසිර පවතින ජීවන ක්‍රියාවලිය ඇසුරු කරමිනි. ශ්‍රී ලාංකේය ජන සමාජයෙන් බිහි වූ නිර්නාමික කලා නිර්මාණ විශේෂයක් ලෙස ඒවා සුවිශේෂ ය. විවිධ ක්ෂේත්‍ර පුරා පැතිර පවතින ප්‍රේමය, රාගය හා ව්‍යභිචාර ජන ගීත ශ්‍රී ලාංකික අනන්‍යතාව හෙළිකරන කැටපතක් ලෙස අගය කළ යුතු ය. ගැමියා ජීවත් වන සමාජයේ ඕනෑ එපාකම් මත ගොඩනැගී ඇති කලාවක් වන හෙයින් එය සෑම සමාජයකට ම පොදු ය;. එමෙන් ම අව්‍යාජ ය. එහෙයින් පාරම්පරික දායාදයක් ලෙස උරුම වූ එකී ජන ගීත මුඛ පරම්පරාගත ව යළි උරුම කර-වීම පොදු අවශ්‍යතාවකි.

### ආශ්‍රිත ග්‍රන්ථ


අමරසේකර, දයා. (1996). *ජන කවිය සහ ගැමි සමාජය.* ආර්ය ප්‍රකාශකයෝ.

ඔරුමාන්කුලමේ, සී. (1996). *නුවරකලාවියේ ජන කවි විමර්ශන හා ස්ථාවරය.* ප්‍රතිකඩ ප්‍රකාශකයෝ

ගුණසේකර, බන්දුසේන. (2007). *ජනකවි සාහිත්‍ය විචාර ලිපි සරණිය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණසෝම, ගුණසේකර. (1999). *පානම් පත්තුවේ ජනකවි.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චන්දන, බී.(සංස්.) (1995). *පන්සිය පනස් ජාතක පොත් වහන්සේ,* කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

ඩයස්, හර්සන්. (2003). *ජන සාහිත්‍ය සම්ප්‍රදාය.* වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය,

ඩයස්, හර්සන්. (2004). *මහනුවර මාතර ජනකවි සාහිත්‍යය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඩයස්, හර්සන් (සංස්.). (2009), *සංස්තුති.* කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

තිලකරත්න, මිණිවන් පී. (1971). *ජන කවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ.* ළපානී මුද්‍රණ ශිල්පී ප්‍රකාශකයෝ

ද සිල්වා, ඩබ්ලිව්. ආතර්. හා මලලසේකර, ගුණපාල. (2009). *සිංහල ජනසම්මත කාව්‍ය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දේවමුල්ල, උපාලි. (2002). *සිංහල ජන කවි ,ජනක්‍රී හා වන්නම්.* නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ

පරණවිතාන, රෝහිණී. (1990). හියූ නෙවිල් රැස් කළ ජන ගී පිළිබඳ අධ්‍යනයක්. *ජන ගී මිහිර.* කොළඹ: සංස්කෘතික අමාත්‍යාංශය

ප්‍රේමතිලක, මීමන. (1963). *නවීන පද්‍ය රචනා -02.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

ලොකුහේවා, සඳරුවන්. (1996). *බින්තැන්නේ ඇත්තෝ.* වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

ලොකුහේවා, සඳරුවන්. (1999). *බැද්දේ ජනකවි,* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරක්කොඩි, ඉරංගා සමින්දනී. (2013). *නැළවිලි ගීයෙන් නිරූපිත සිංහල ජනශ්‍රැතිය,* ජයම්හිර නිර්මාණ.

වීරක්කොඩි, ඉරංගා සමින්දනී. (2017). *ජන සංගීත විමර්ශන.* ජනම්හිර නිර්මාණ.

සිරිපාල, නෝමන්. (2002). *ගොවිගෙදර ජන කවි.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

සිරිසේන, කොත්මලේ. (2011). *සිංහල ජන කවි.* නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ

සුනිල්, එල්. බණ්ඩාර. (2012). *ජන කවිය හා සමාජ තොරතුරු,* නැණිල පබ්ලිකේෂන්

සේනාරත්න, පී.ඇම්. (2010). *ශ්‍රී ලංකාවේ ජනකවි.* නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ

හෙට්ටිගේ, එන්. අමරසිරි. (1995). *ජන කවියේ ධීවර ලකුණ,* කර්තෘ ප්‍රකාශන

විජේතුංග, එච්. (සංස්.). (1996), *නීති නිගන්ඩුව*